කාර්ය සාධන වාර්තාව

வருடாந்தச் செயலயாற்றுகை அறிக்கை

ANNUAL PERFORMANCE REPORT

2024

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

Ministry of Industry and Entrepreneurship Development

2024 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

වැය ශීර්ෂ අංකය : 149

මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.

පටුන

	පිටුව
හැඳින්වීම	V
පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 6
පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම	7 - 40
පරිච්ඡේදය 03 : වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය	41 - 52
පරිච්ඡේදය 04 : කාර්ය සාධන දර්ශකය	53 - 56
පරිච්ඡේදය 05 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	57 -60
පරිච්ඡේදය 06 : මානව සම්පත් පැතිකඩ	61 - 74
පරිච්ඡේදය 07 : අනුකූලතා වාර්තාව	75 - 84
ඇමුණුම්	i - xv

හැඳින්වීම

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ **2024** වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 මගින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය තුළින් අමාත්‍යාංශයේ ආයතනික පැතිකඩ සහ ක්‍රියාවට නැංවීමේ සාරාංශය දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු, සංවිධාන ව්‍යුහය, අමාත්‍යාංශය යටතේ පවතින අංශයන් සහ අමාත්‍යාංශය යටතට අයත් වන සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු සංක්ෂිප්තව ඇතුළත් කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින අංශ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් දෙවන පරිච්ඡේදය මගින් සවිස්තරාත්මකව දක්වා ඇත .

තුන්වන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ **2024** වර්ෂයේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධන දර්ශකයක් අනුව ළඟා කරගෙන ඇති ප්‍රගතිය හතර වන පරිච්ඡේදය තුළින් ද සංක්ෂිප්තව දක්වා ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශය දක්වන ලද දායකත්වය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව පස්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

හයවන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ දක්වා ඇති අතර ඒ තුළින් අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව, ක්‍රියාත්මක කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත.

ඉහත චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘති පත්‍රය පරිදි ලබා ගැනීමට අපේක්ෂිත වූ කාර්ය සාධනය පිළිබඳ වූ අනුකූලතා වාර්තාව හත්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

පරිච්ඡේදය 01

ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

"තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම"

මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළෙඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම"

අරමුණු

- **2023 වසරේ 26% ක් වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 28% දක්වා වැඩි කිරීම.**
- **2023 වසරේ 16.2% ක්වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය 2030 වසර වන විට 20% දක්වා වැඩි කිරීම.**
- **2023 වසරේ 3.2% ක්වූ ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය 2030 වසර වන විට 10% දක්වා ඉහළ නැංවීම.**
- **2030 වසර වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි කාර්මික (වෙළඳ භාණ්ඩ) අපනයන කොටස 20.5% සිට 25% දක්වා වැඩි කිරීම (2023 දී ඇ.ඩො. බිලියන 84 ක සමස්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් ඇ.ඩො. බිලියන 17.5) (2030 වන විට දී ඇ.ඩො. බිලියන 28)**
- **2023 වසරේ 0.01% ක්වූ කර්මාන්ත කටයුතු සඳහා වෙන් කල ඉඩම් ප්‍රමාණය 2030 වසර වන විට 1% දක්වා වැඩි කිරීම. (ජාත්‍යන්තර සම්මතය 3%).**

1.2 ආයතනික ව්‍යුහය



1.2 ආයතනික ව්‍යුහය



1.3 අමාත්‍යාංශය යටතේ පවතින අංශ සහ ආයතන

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ප්‍රතිපත්ති සංවර්ධන අංශය
2. කර්මාන්ත සංවර්ධන අංශය
3. ආංශික සංවර්ධන අංශය
   - 3.1 සංවර්ධන අංශ 1
   - 3.2 සංවර්ධන අංශ 2
   - 3.3 සංවර්ධන අංශ 3
4. කර්මාන්ත ලියාපදිංචි අංශය
5. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
7. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
8. සැලසුම් අංශය
9. පාලන අංශය
10. ගිණුම් හා ප්‍රසම්පාදන අංශය

අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

- පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
- ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
- කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
- ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
- ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
- සී/ස ජාතික කඩදාසි සමාගම (NPCL)
- ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
- සී/ ස ලංකා ෆොස්ෆේට් සමාගම (LPL)
- ජාතික ලුණු සමාගම (NSL)
- සී/ස ලංකා සිමෙන්ති සමාගම (SLCC)
- පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ් (PCCL)
- සීමාසහිත බී.සී.සී ලංකා සමාගම (BCC)
- ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
- ජාතික ශිල්ප සභාව (NCC)
- සීමාසහිත ලංකා සළුසල (LSL)
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)
- කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
- උක් පර්යේෂණ ආයතනය (SCRI)
- ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)
- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)
- කන්තලේ සීනි සමාගම (KSCL)
- සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
- ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම

පරිච්ඡේදය 02

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ප්‍රතිපත්ති සංවර්ධන අංශය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය (NaPID) සකස් කර ඇත.
- ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදනය / එකලස් කිරීම සහ මෝටර් රථ උපාංග කොටස් නිෂ්පාදනය සඳහා සම්මත මෙහෙයුම් පටිපාටිය (SOP) යටතේ 2024 වසර තුළ මෝටර් වාහන 63,331 (සිව්රෝද 2,010 සහ ද්වීරෝද 61,291 හා විදුලි ත්‍රීරෝද 30) එකලස් කර ඇත.
- ප්‍රතිපත්ති සංවර්ධන අංශය, අවම වශයෙන් 30% දේශිය අගය එකතුකිරීමක් සහිත (HS පරිච්ඡේද 84 සහ 85 යටතේ) දේශීයව නිෂ්පාදිත විදුලි උපකරණ සඳහා නිෂ්පාදන බද්දෙන් නිදහස් කිරීම සඳහා අනෙකුත් අදාළ ආයතන සමග සහයෝගයෙන්, නිර්දේශ ලබා දීම සිදු කර ඇත.
- ප්‍රතිපත්ති සංවර්ධන අංශය දේශීයව මෝටර් රථ එකලස් කිරීමේ දී මෝටර් රථ එකලස් කරන්නන් සහ නිෂ්පාදකයින් මුහුණ දෙන ගැටලු සහ අත්දැකීම් මත පදනම්ව සම්මත මෙහෙයුම් පටිපාටිය සමාලෝචනය කිරීම ආරම්භ කර ඇත.
- වාහන නිෂ්පාදනය, එකලස් කිරීම හා මෝටර් රථ උපාංග කොටස් නිෂ්පාදන අංශයට අදාළ ජාතික ප්‍රතිපත්තියක් ආරම්භ කළ අතර එහි පළමු කෙටුම්පත අවසන් කර ඇත.

ඉදිරි සැලසුම්

- දේශිය මෝටර් රථ නිෂ්පාදන සහ එකලස් කිරීමේ කර්මාන්තයේ මෙන්ම මොටර් රථ උපාංග නිෂ්පාදන කර්මාන්තයේ නියැලීම සඳහා දේශීය සමාගම් සමග හවුල් ව්‍යාපාර මගින් විදේශීය හා දේශිය ආයෝජන දිරිමත් කිරීම.
- ශ්‍රී ලංකාවේ මෝටර් රථ නිෂ්පාදන / එකලස් කිරීමේ කර්මාන්තය සහ මෝටර් රථ සංරචක නිෂ්පාදන කර්මාන්තය සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) 2025 මුල් භාගයේ දී අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, යාවත්කාලීන කරන ලද සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය 2025 දී දෙවන අනුවාදයේ දී දියත් කිරීමට නියමිතය.
- උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්ම අවසන් වූ පසු මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්තය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය 2025 දී කැබිනට් අනුමැතිය සඳහා විධිමත් ලෙස ඉදිරිපත් කිරීමට නියමිතව ඇත.
- දේශීය විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ එකලස් කිරීමේ/ නිෂ්පාදනය කිරීමේ අනාගත නිෂ්පාදන ධාරිතාව පුළුල් කිරීම, තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ක්ෂේත්‍රයේ සමස්ත තරඟකාරීත්වය ඉහළ නැංවීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

2.2 කර්මාන්ත සංවර්ධන අංශය (IDD)

ප්‍රගතිය/ ජයග්‍රහණ

- අමාත්‍යාංශය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 20ක විදුලිය, ජලය සහ මාර්ග වැනි යටිතල පහසුකම් සහිත අක්කර 1,049.82ක ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කර කර්මාන්තපුර 33ක් ස්ථාපිත කර ඇත.

- නව කර්මාන්තපුර 06ක් ආරම්භ කිරීමට අදාළ සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

- එම කර්මාන්තපුර 33හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් රු. මිලියන 4,070.49 පමණ වැය කර ඇති අතර ඊට අමතරව ඉහත සඳහන් කර්මාන්තපුරවල කර්මාන්තශාලා පිහිටුවීම සඳහා පෞද්ගලික අංශය විසින් රු. මිලියන 76,724.45ක් ආයෝජනය කර ඇත.

- කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ වාණිජ කටයුතු සිදු කරනු ලබන සක්‍රිය කර්මාන්ත සංඛ්‍යාව 382ක් වන අතර රැකියා අවස්ථා 23537ක් මේ මගින් බිහි කොට ඇත.

- මේ වසරේ දී කර්මාන්තපුරවල හිස් ඉඩම් සඳහා නව ආයෝජකයන්ගේ ව්‍යාපෘති 24ක් සඳහා ඉඩම් වෙන් කිරීම් සිදුකර ඇත.

- රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශේෂිත වූ එරාවූර් කර්මාන්ත කලාපයේ -
  අප ජලය මුහුදට බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 100% ක් නිම කර ඇත.
  විදුලි බලය ලබා දීමේ කටයුතු 100% ක් අවසන් කර ඇත.
  පිවිසුම් මාර්ග සංවර්ධන කටයුතු අදියර -1 = 100% හා අදියර-2 = 100% ක් නිම කර ඇත.
  ජල සැපයුම සඳහා ජලනල සවි කිරීම 100% අවසන් කර ඇත.
  භූගත ජල ටැංකිය ඉදිකිරීම 45% අවසන් කර ඇත.

- පවතින කර්මාන්තපුරයන් වන දංකොටුව, අම්පාර-නවගම්පුර, කරන්දෙණිය, නාලන්ද එල්ලාවල අදියර -1, නාලන්ද එල්ලාවල අදියර -2, මතුගම, බටඅත, හා උලපනේ යන කර්මාන්තපුරයන්හි ජලය, විදුලිය, මාර්ග සංවර්ධනය ආදී යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම.

- නව කර්මාන්තපුර පිහිටුවීම සඳහා ඉඩම් වෙන් කරගෙන ඇති අළුතැපොල, දඹුල්ල, සූරියවැව, කටුනායක, රයිගම යන කර්මාන්තපුරයන් හි ජලය, විදුලිය, මාර්ග සංවර්ධනය ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

- බදු ගිවිසුම් සකස් කිරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා ජංගම සේවාවන් 2 පැවැත්වීමට කටයුතු සිදු කළ අතර බදු අයකර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

අභියෝග

- කර්මාන්තපුරවල යටිතල සහසුකම් සංවර්ධන කටයුතු සඳහා සම්බන්ධ වන රාජ්‍ය ආයතනවල ප්‍රමාද වීම.
- රටෙහි පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් භාණ්ඩවල මිල උච්චාවචනය වීම නිසා ඇස්තමේන්තු ගත පිරිවැයෙහි ඇතිවන ගැටළුකාරී තත්ත්වයන්
- කර්මාන්ත සඳහා සුදුසු ඉඩම් ලබාගැනීමට ඉතා අසීරු වීම.

ඉදිරි සැලසුම්

- නව ආයෝජන අවස්ථා හඳුනා ගැනීම.
- හරිත කර්මාන්තකරණය සඳහා කර්මාන්තකරුවන් මෙහෙය වීම.
- පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති කටුනායක, අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම, සූරියවැව, යන නව කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කර අවසන් කිරීමට කටයුතු කිරීම.
- කර්මාන්තපුරවල කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා අවම වශයෙන් නව ව්‍යාපෘති 30 සඳහා සුදුසු ඉඩම් ලබා දීම සඳහා කටයුතු සිදු කිරීම.
- අවම වශයෙන් ආයෝජකයන් 50ක් සඳහා නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දීමට කටයුතු කිරීම.
- රයිගම අදියර 02, ඉංගිරිය, පරන්තන්, වාලච්චේන, පුලියන්කුලම, ආරච්චිකට්ටුව, තිහගොඩ, මාවතගම, ඇලයාපත්තුව හා බිංගිරිය යන කර්මාන්තපුර 2025 වර්ෂයේ ස්ථාපිත කිරීමට කටයුතු කිරීම.

2.3 ආංශික සංවර්ධන අංශ

සංවර්ධන අංශ I

ප්‍රගතිය/ ජයග්‍රහණ

- Profood Propack ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය-2024 දේශීය හා විදේශීය කර්මාන්ත ප්‍රදර්ශකයින් 50 දෙනෙකුගේ සහභාගීත්වයෙන් ප්‍රදර්ශන කුටි 350කින් හා නරඹන්නන් 2400කින් සමන්විතව ආහාර නිෂ්පාදනයේ නියුක්ත සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත හිමියන් සඳහා විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයක් ද ඇතුළත්ව ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම.
- ලංකා ඇසුරුම් ප්‍රදර්ශනය (Lanka pack Exhibition) දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 150කින් හා නරඹන්නන් 8000 දෙනෙකුගෙන් සමන්විතව සාර්ථකව පවත්වන ලදී.
- ඇසුරුම් කර්මාන්ත අංශයේ තෝරාගත් කර්මාන්තවල සේවයේ නියුතු සේවකයින් 28 දෙනෙකු සඳහා ඇසුරුම් තාක්ෂණය පිළිබඳ වූ සහතික පත්‍ර පුහුණු පාඨමාලාව ශ්‍රී ලංකා ඇසුරුම් ආයතනය හා එක්ව ක්‍රියාත්මක කර සාර්ථකව නිම කිරීම.

- ජාත්‍යන්තර තත්ත්ව සහතික කරන වැඩසටහන ISO -9001, ISO-14001,ISO-22000,ISO-50001 සඳහා කර්මාන්ත 33ක් තෝරා ගන්නා ලද අතර ඉන් සහතික කරන ක්‍රියාවලිය සාර්ථකව නිම කළ කර්මාන්ත සංඛ්‍යාව 20ක් වේ.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන සඳහා කර්මාන්ත 35ක් තෝරා ගන්නා ලද අතර ඉන් සහතික කරන ක්‍රියාවලිය සාර්ථකව නිම කළ කර්මාන්ත සංඛ්‍යාව 12ක් වේ.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීමේ ව්‍යපෘතිය අමාත්‍යාංශය හා මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය සමග ඒකාබද්ධව ක්‍රියාත්මක වන අතර මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත වන කාර්මික ශිල්පීන්ගේ කුසලතා හා තාක්ෂණික දැනුම වර්ධනය කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. මැණික් කැපීම හා ඔප දැමීම සහ ස්වර්ණාභරණ නිෂ්පාදනය යන පාඨමාලා 12ක් සාර්ථකව අවසන් කර ඇත.

අභියෝග

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක භාවයෙන් යුතු සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයන් සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය උසස් කිරීම, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුළින් ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම.
- උසස් ගුණත්වයෙන් යුතු අගය එකතු කරන ලද දේශීය ඇසුරුම් නිෂ්පාදිත වලින් අනෙකුත් කර්මාන්ත නිෂ්පාදන සඳහා අවශ්‍ය ඇසුරුම් සහ අපනයන භාණ්ඩ සඳහා අවශ්‍ය ඇසුරුම් සපුරා ගැනීම.

ඉදිරි සැලසුම්

- සැකසූ ආහාර කර්මාන්තවල නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම.
- දේශීය අගය එකතු කළ ආහාර නිෂ්පාදනවල අපනයන වර්ධනය කිරීම.
- ඉහළ ගුණාත්මක තත්වයෙන් යුතු නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා ඉදිරිපත් කිරීම.
- ඉහළ ගුණත්වයකින් සහ ධාරිතාවයකින් ඇසුරුම් නිෂ්පාදනය කිරීම සඳහා ඇසුරුම් කර්මාන්ත පෙළඹවීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයන්ගේ ඵලදායිතාවය වැඩි කිරීම සඳහා සේවා නියුක්ත ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොළ තරඟකාරීත්වය සහ තිරසාරත්වය ඉහළ නැංවීම තුළින් ආදායම් හා රැකියා උත්පාදන හැකියාව ඉහළ යාම හා එම කර්මාන්තවල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශිය වශයෙන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශිය වෙළපොළ සකස් කර ගැනීමට සහය විම.

- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.
- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමගින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව කටයුතු කර එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.
- කර්මාන්තකරුවන් තම සේවකයින්ගෙන් අපේක්ෂා කරන කුසලතා සහ සේවකයින් සතුව ඇති සැබෑ කුසලතා අතර විෂමතාවය (Skill Gap) අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරිම.

සංවර්ධන අංශ II

ප්‍රගතිය/ ජයග්‍රහණ

- දේශීය කර්මාන්ත සඳහා සම්පත් කාර්යක්ෂම පිරිසිදු නිෂ්පාදන (RECP) ඇගයීම සහ ධාරිතාව ගොඩනැගීමේ වැඩසටහන ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව සිදුකරන ලද ව්‍යාපෘතියක් වන අතර, මෙහි දී කර්මාන්ත ආයතන 15ක් සඳහා මෙම ව්‍යාපෘතිය 2024 වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. මෙමගින් කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සිදුවේ.

- අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් කිරීමේ මගක් බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි පිහිටු වීමට අවශ්‍ය මූලික කටයුතු මේ වන විට ආරම්භ කර ඇති අතර, මෙය 2025 වර්ෂය තුළ නිම කිරීමට අපේක්ෂිතය. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ වශයෙන්, බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන ආදායම ඉහළ යාම, රැකියා අවස්ථා ඉහළ යාම හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට මෙය ඉවහල් වීම දැක්විය හැකිය.

- විදුලි හා විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීමට රජයෙන් සහන ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ 2024 වසර තුළ විදුලි හා විද්‍යුත් නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලි සිටින දේශීය කර්මාන්ත ආයතන 05 ක් සඳහා ප්‍රතිලාභ ලබාදීම සිදු විය. විදුලි හා විද්‍යුත් කර්මාන්ත ක්ෂේත්‍රයන්හි නියැලී සිටින කර්මාන්ත, වෙළෙඳ පොළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හා විදේශීය වෙළෙඳ පොළවල් සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තරව පිළිගත් තත්ත්ව සහතික/ රසායනාගාර වාර්තා ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති බැවින්, එවැනි තත්ත්ව සහතික/ රසායනාගාර වාර්තා ලබා ගැනීමට අපේක්ෂා කරන දැනට භාණ්ඩ අපනයනය කරන හා අපනයනය කිරීමට බලාපොරොත්තු වන කර්මාන්ත සඳහා, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු විය.

- වාහන උපාංග නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නියැලි කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යන්තරව පිළිගත් IATF 16949:2016 තත්ත්ව සහතිකය ලබාගැනීමට රජයෙන් සහන ලබා දීමේ ව්‍යාපෘතිය යටතේ 2024 වසර තුළ වාහන උපාංග නිෂ්පාදන ක්ෂේත්‍රයන්හි නියැලී සිටින කර්මාන්ත ආයතන 02ක් සඳහා ප්‍රතිලාභ ලබාදීම සිදු විය. වෙළෙඳපොළ තරඟකාරීත්වයට සාර්ථකව මුහුණ දීමට හා අපනයන වෙළෙඳ පොළවල් සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීමට ජාත්‍යන්තරව පිළිගත් තත්ව සහතික ලබා ගැනීම අත්‍යාවශ්‍ය කරුණක් වී ඇති බැවින් ජාත්‍යන්තරව පිළිගත් තත්ත්ව සහතිකයක් වන IATF 16949:2016 තත්ත්ව සහතිකය ලබා ගැනීමට අපේක්ෂා කරන දැනට භාණ්ඩ අපනයනය කරන හා අපනයනය කිරීමට බලාපොරොත්තු වන කර්මාන්ත සඳහා, මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සිදු විය.

- මෙම අමාත්‍යාංශය, සැපයුම් දාම හා ද්‍රව්‍ය කළමනාකරණ ආයතනය හා එක්ව විවිධ කර්මාන්ත අංශ නියෝජනය වන පරිදි තෝරාගත් නිෂ්පාදන කර්මාන්ත 30ක් සඳහා කාර්යක්ෂම සැපයුම් දාම කළමනාකරණ පද්ධතියක් හඳුන්වාදීම හා පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදේශන සේවා සැපයීමේ වැඩසටහනක් 2024 වසර තුළ ක්‍රියාත්මක කිරීම සිදු විය.

- කර්මාන්ත ආයතනයන් විසින් කාර්යක්ෂම සැපයුම්දාම කළමනාකරණ පද්ධතියක් පවත්වාගෙන නොයාම හේතුවෙන් කර්මාන්ත ශාලාවන්හි අමුද්‍රව්‍ය අපතේ යාම්, නිමි භාණ්ඩ කල් ඉකුත් වීම් හා අනෙකුත් සැපයුම් සේවා නිසි වේලාවට සිදුකර ගැනීමට නොහැකි වීම වර්තමානයේ කර්මාන්ත ආයතන මුහුණ දෙන විශාල ගැටළුවක් වන අතර මෙයට පිළියමක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සිදු විය.

අභියෝග

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දියහැකි ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදනයන් සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා දේශීය නිෂ්පාදනවල ගුණාත්මකභාවය උසස් කිරීම, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුළින් ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම.
- රට තුළ වර්තමානයේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය, නව බදු ප්‍රතිපත්තීන් හා බලශක්ති පිරිවැය ඉහළ යාම නිසා කර්මාන්ත ආයතනවලට මුහුණ දීමට සිදු වී ඇති බලපෑම අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

ඉදිරි සැලසුම්

- කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සඳහා වූ වැඩසටහන් ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව ඉදිරි වසරවල දී ද ක්‍රියාත්මක කිරීම.

- ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා දේශීය කර්මාන්තකරුවන් උනන්දු කිරීම පිණිස එම ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා අවශ්‍ය මුල්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගක් බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි ඉදි කිරීම.

- දැව භාණ්ඩ නිෂ්පාදන කර්මාන්තයේ නියුක්ත සුළු පරිමාණ කර්මාන්තයන්හි තාක්ෂණික ශිල්පීන්ගේ කුසලතා නංවාලීම සඳහා දේශීය පුහුණු පාඨමාලා සඳහා තාක්ෂණික ශිල්පීන් යොමු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- අගය එකතු කළ නිෂ්පාදන සඳහා දේශීය කර්මාන්තකරුවන් වැඩි වශයෙන් යොමු කිරීම සඳහා වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික හා ISO සහතික ලබා ගැනීම සඳහා දේශීය කර්මාන්තකරුවන් උනන්දු කිරීම පිණිස එම ප්‍රමිති සහතික ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

සංවර්ධන අංශ III

ප්‍රගතිය/ ජයග්‍රහණ

- කර්මාන්ත අමාත්‍යාංශය සහ පාවහන් සහ සම් නිෂ්පාදකයින්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද පාවහන් සහ සම් ප්‍රදර්ශනය 2024 පෙබරවාරි 8 සිට 11 දක්වා BMICH හිදී පැවැත්විණි. මෙම ප්‍රදර්ශනය සඳහා කර්මාන්ත අමාත්‍යාංශය රුපියල් මිලියන 4 ක අනුග්‍රහයක් ලබා දුන්නේය.
- ලංකා ජාතික කර්මාන්ත මණ්ඩලය 2023 CNCI ජයග්‍රාහක සම්මාන උළෙල 2024 ඔක්තෝම්බර් 15 වන දින පැවැත්වීය. කර්මාන්ත අමාත්‍යාංශය රුපියල් මිලියන 3 ක අනුග්‍රාහක දායකත්වයක් ලබා දී ඇත.
- Lean කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් වැඩසටහන් 3 ක් ලෙස පවත්වන ලද අතර මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 300 ක් පමණ වේ. මුළු පිරිවැය මිලියන 0.6 කි
- තෝරාගත් අපේක්ෂකයින් 15 දෙනෙකු සමඟ සම්පත් කාර්යක්ෂම නිෂ්පාදන තක්සේරුව පවත්වන ලදී. මුළු පිරිවැය මිලියන 6 කි.
- ආපදා කළමනාකරණ සැලැස්ම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන 2024 ජූලි 4 වන දින පැවැත්විණි. මුළු ප්‍රතිලාභීන් කර්මාන්තකරුවන් 50 ක් පමණ වේ. මුළු පිරිවැය මිලියන 0.15 කි.
- ශ්‍රී ලංකා-තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමේ අවස්ථා සහ ඇඟවුම් ගවේෂණය කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය 2024.02.29 වන දින සහභාගීවන්නන් 200 දෙනෙකු සමඟ පැවැත්විණි.

ඉදිරි සැලසුම්

- 2007 වර්ෂයේ සිට පවත්වන සම් හා පාවහන් ප්‍රදර්ශනය 2025 වර්ෂයේ පෙබරවාරි මස 6 සිට 9 දක්වා බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්වීමට කටයුතු යොදා ඇත.
- කොළඹ විශ්වවිද්‍යාලයේ රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා මානව පුනරාවර්තන අපහාස පැච් පරීක්ෂණයක් පැවැත්වීම සඳහා පහසුකමක් ස්ථාපිත කිරීමට රු.මි. 27.4 ක ප්‍රතිපාදන වෙන් කිරීමට නියමිතය.
- කර්මාන්තකරුවන්ගේ කාර්ය සාධන විශිෂ්ඨත්වය ඇගයීම වෙනුවෙන් CNCI Achievers Awards 2025 පැවැත්වීමට අපේක්ෂිතය.
- කර්මාන්තකරුවන් සඳහා ජාත්‍යාන්තර කර්මාන්ත හා වෙළඳ ප්‍රදර්ශනවලට සහභාගී වීමට අවශ්‍ය පහසුකම් ලබා දීමට සැලසුම් කර ඇත.
- නිෂ්පාදන කර්මාන්ත සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (ආපදා කලමනාකරණ වැඩසටහන) ආපදා කලමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත්දායකත්වය සහිතව පැවැත්වීමට කටයුතු යොදා ඇත.

2.4 කර්මාන්ත ලියාපදිංචි අංශය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 2024 දෙසැම්බර් 31 දක්වා නිෂ්පාදන කර්මාන්ත 3989 ක් ලියාපදිංචි කර ඇත.
- මෙම වසර වන විට Manual ක්‍රමය යටතේ ලියාපදිංචි කිරීම මාර්ගගත පද්ධතියක් බවට පරිවර්තනය කර ඇත. එම ක්‍රියාවලිය 2024 මැයි මාසයේ දී එළිදක්වන ලදී.
  පසුව ක්‍රියාත්මක කිරීමේ දී පැන නැඟුණු ගැටළු හේතුවෙන් තව දුරටත් එහි සංවර්ධන කටයුතු සිදු කරමින් පවති.
- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනතේ සංශෝධන තුළ කාර්යක්ෂම කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය සහතික කිරීම සඳහා ශක්තිමත් නීතිමය ප්‍රතිපාදන එකතු කර ඇත.
- 2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 වන දින දක්වා මෙම අමාත්‍යාංශය වෙත අයදුම්පත් 231ක් ලැබී ඇති අතර, ඒ අතරින් කර්මාන්ත 203ක් මෙම අමාත්‍යාංශයට අදාළ අංශයන් 09 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉදිරි සැලසුම්

- අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීම.

2.5 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU)

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)
2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SMILE III-Revolving Funds)

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මගින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාරවල ඵලදායීතාවය වර්ධනය කිරිම හෝ එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරිම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.
- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව වේ.

ප්‍රගතිය/ ජයග්‍රහණ

සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 360ක් සඳහා රුපියල් මිලියන 2684ක් මුදා හරින ලදී.

- 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රුපියල් මිලියන 2700
- වියදම - රුපියල් මිලියන 2684

2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E-Friend II)

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ, එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව, ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසිං සමාගම වේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

ප්‍රගතිය/ ජයග්‍රහණ

සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 44ක් සඳහා රුපියල් මිලියන 668ක් මුදා හරින ලදී.

- 2024 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රුපියල් මිලියන 800
- වියදම - රුපියල් මිලියන 668

ඉදිරි සැලසුම්

- කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය III - (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)

  2025 වර්ෂය සඳහා රු.මි. 3500.00 ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර දළ වශයෙන් උප ව්‍යාපෘතීන් 375ක් සඳහා ලබා දීමටත් එමගින් නව රැකියා අවස්ථා 2,300ක් පමණ ජනිත කිරීමටත් අපේක්ෂා කරයි.

- පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

  2025 වර්ෂය සඳහා රු.මි. 1500ක ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කර ඇති අතර මෙම මුදල දළ වශයෙන් ව්‍යාපෘති 110ක් සඳහා ලබා දීමට බලාපොරොත්තු වේ. එමගින් සම්පත් ඉතිරි කිරීම, සම්පත් ප්‍රතිසාධනය, වෙනත් කර්මාන්ත සඳහා අපද්‍රව්‍ය නැවත භාවිතා කිරීම, අප ජලය පිරිපහදු කිරීම, ප්‍රතිචක්‍රීකරණය කිරීම සහ බලශක්ති ඉතිරි කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය මගින් මූල්‍ය සහාය ලබා දීම තුළින් පරිසර හිතකාමී කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම අපේක්ෂා කෙරේ.

2.6 පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාව රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම.

  ඇඹිලිපිටිය කඩදාසි කම්හලෙහි නිෂ්පාදන කටයුතු රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරිත්ව ක්‍රමවේදය යටතේ නැවත ආරම්භ කිරීම සඳහා අංක: අමප/22/0254/320/010 හා 2022.02.28 දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර 2024.04.08 දින කොරියන් ස්පා පැකේජින් (පුද්) සමාගම විසින් සී/ස ජාතික කඩදාසි සමාගමට අයත් ඇඹිලිපිටිය කඩදාසි කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු ආරම්භ කරන ලදී. මෙම කර්මාන්තශාලාව මගින් සිදු කිරීමට අපේක්ෂිත වාර්ෂික කඩදාසි නිෂ්පාදනය මෙ.ටො. 74250 කි.

- **2024** ජනවාරි - දෙසැම්බර් දක්වා ඛනිජවැලි අලෙවිය තුළින් උපයාගෙන ඇති ආදායම ඇමරිකන් ඩොලර් **2,283,256.57**ක් (රාජ්‍ය භාගය රහිතව) වේ.

ඉදිරි සැලසුම්

- කහටගහ පතලෙහි පවතින මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමවේදය අනුව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.
- ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්හි කැණීම් කරනු ලබන ඛනිජවැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීමට අපේක්ෂිතය.

2.7 ප්‍රාථමික කර්මාන්ත අංශය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ ආර්ථික දායකත්වය**

  2024 දෙසැම්බර් මස 31 දින වන විට මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති නිශ්පාදන අපනයනය කිරීම තුළින් උපයාගෙන ඇති අපනයන වටිනාකම ඇමරිකන් ඩොලර් මිලියන 355 කි.

- **ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව**

  ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයෙන් තුනෙන් දෙකකට වඩා වැඩි ප්‍රමාණයක් එනම් 70%ක් පමණ මැණික් නිධි පවතින බව ඇස්තමේන්තු කර ඇති අතර, මෙම සම්පත්වලින් මේ වන විට 20%ක් පමණක් මේ දක්වා ගවේෂණය කර ඇත.

  * 2024 වර්ෂයේ දී මෙම ව්‍යාපෘතිය යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මූලික මැණික් විභව සිතියම් ගත කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- **මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම**

  * 2024 වර්ෂය සඳහා ඉලක්ක ගත සිසුන් සංඛ්‍යාව 1276ක් වූ අතර, 2024 දෙසැම්බර් මස 31 වන විට සිසුන් 1335 දෙනෙකු බඳවා ගෙන ඇත. මෙම වර්ෂයේ දී පාඨමාලා නිම කළ සිසුන් ප්‍රමාණය 507ක් වන අතර සිසුන් 746 දෙනෙකු තවදුරටත් පාඨමාලාව හදාරමින් සිටී.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටළු සාකච්ඡා කර විසඳුම් ලබා දීම සඳහා පියවර ගැනීම.
- ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පනත සංශෝධනය කිරීමට අදාළ පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා ඇතුළත් කරමින් සංශෝධිත පනත් කෙටුම්පත් සකස් කර ඇති අතර, එය තවදුරටත් අධ්‍යනය කර, අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.
- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළ මහජන පැමිණිලි විමර්ශනය කිරීම.

- විදේශිකයින් විසින් අනවසරයෙන් සිදු කරන මැණික් වෙළඳාම පාලනය කිරීමේ අරමුණින් ඒ සඳහා වන යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, එකී ක්‍රමවේදය 2025 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.
- 2024 ජනවාරි මස ශ්‍රී ලංකාවේ දී ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය හා පහසුකම් සැලසීමට කටයුතු කරන ලදී.
- ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට නිපුණ ශ්‍රමය සහ නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා තායිලන්තයේ මැණික් හා ස්වර්ණාභරණ සංගමය හා ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇත.

ඉදිරි සැලසුම්

- මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2024 වර්ෂයට සාපේක්ෂව දෙගුණයකින් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේ දී පැවැත්වීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය සිදු කිරීම.
- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.
- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ග ද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- මැණික් තාපකරණය, අගය වැඩි කිරීම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සංවර්ධනය කිරීම හා බඳවාගන්නා පුහුණුලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට කටයුතු කිරීම හා අවශ්‍යතාවය පරිදි නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරීමට කටයුතු කිරිම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමග විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.
- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.
- මැණික් අපනයනය සඳහා නව වෙළඳ පොළවල් හඳුනාගැනීම හා එම වෙළඳපොළවල් සමග ගිවිසුම් ගත වීම.
- කර්මාන්තය නියාමනය හා සංවර්ධනය කිරීම සඳහා සුදුසු සංශෝධන සිදු කිරීම.

2.8 කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සංවර්ධන අංශය (SMED

ප්‍රගතිය/ ජයග්‍රහණ

මෙම අංශය විසින් 2024 වසරේ දී පහත සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- සම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන (රු.මි. 100)
- අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන (රු.මි. 80)
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම (රු.මි. 300)
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම.

- **සම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන (රු.මි. 100)**

– **ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරීමේ වැඩසටහන**

පාරම්පරික හස්ත කර්මාන්ත සඳහා උපයෝගිකොට ගන්නා අමුද්‍රව්‍ය ශාක වගා කිරීමේ වැඩසටහන මගින් 2024 වසර තුළ දී අක්කර 17 පර්චස් 90ක පන් පැළ 517,500 වගා කිරීමට පියවර ගෙන ඇත.

වියදම - රු.මි. 6.36 කි.

– **දැව මෝස්තර හා නිර්මාණ නවෝත්පාදන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම**

මෙම වැඩසටහන මගින් 2024 වසරේ දී කටුබැද්ද යාන්ත්‍රික වඩු කර්මාන්ත මධ්‍යස්ථානයට අයත් ගොඩනැගිල්ල හා යන්ත්‍ර සූත්‍ර අළුත්වැඩියා කොට භාවිතයට ගැනීමට කටයුතු කර ඇත.

පළාත් මට්ටමින් ක්‍රියාත්මක ප්‍රාථමික වඩු පුහුණු පාසල් වලින් තෝරාගත් ශිල්පීන්ගේ උසස් පුහුණු පාඨමාලා 2024 සැප්තැම්බර් 02 දින සිට එහි පළමු අදියර ලෙස ආරම්භ කරන ලදී.

වියදම - රු.මි. 6.9 කි.

– **ග්‍රාමීය හා සාම්ප්‍රදායික කර්මාන්ත නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන**

* "37th session of the FAO Regional Conference" ට සමගාමීව හිල්ටන් හෝටලයේදී ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.
* මාර්තු 28 සිට 30 දක්වා බදුල්ලේ පැවති හස්ත කර්මාන්ත හා ආහාර අලෙවි සල්පිල
  සහභාගී වූ ශිල්පීන් සංඛ්‍යාව -30
* පෙබරවාරි මස 23,24,25 දිනවලදී BMICH පරිශ්‍රයේ "ARCHITECH 2024" ගෘහ නිර්මාණ ප්‍රදර්ශනය සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.
* 2024 මාර්තු 23 හා 24 කොළඹ One Galle Face පරිශ්‍රයේදී "Women Plus Bazar" අලෙවිපොල සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.
* 2024.03.10 දින කොළඹ Galle Face Green "IORA DAY 2024" (Indian Ocean Rim Association) ප්‍රදර්ශනය සඳහා ලක් ශිල්ප නිර්මාණ ඇතුළත් අලෙවි කුටියක් පවත්වාගෙන යන ලදී.

ඉහත සියළු වැඩසටහන් ජාතික ශිල්ප සභාවේ මැදිහත්වීම මත එහි ලියාපදිංචි ශිල්පීන්ගේ සහභාගිත්වයෙන් සිදුකර ඇත.

සපයන ලද මූල්‍ය දායකත්වය - රු.මි. 0.8

– **ශිල්ප අභිමානී ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන ප්‍රදානය**

ජාතික ශිල්ප සභාව මගින් පවත්වනු ලබන ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනය "ශිල්ප අභිමානී - 2024" හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා මූල්‍ය අනුග්‍රහය ලබාදෙමින් මූලික හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 31 ක් යටතේ වූ ශිල්පීන් දිරිමත් කිරීම හා අගය කිරීම සඳහා දායකත්වය ලබාදෙන ලදී.

වියදම - රු.මි. 14.15

- **අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය වැඩසටහන (රු.මි. 80)**

– **අත්යන්ත්‍ර, බතික් සහ රෙදිපිළි කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සංවර්ධනය සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ඌව පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් යොමු කරන ලද පහත සංවර්ධන ව්‍යාපෘති වැඩ අවසන් කර ඇත.

* වර්ණ සංයෝජන රසායනාගාරයක්
* අමුද්‍රව්‍ය ගබඩාවක් ඉදි කිරීම

වියදම - රු.මි. 1.8

කුරුණෑගල ඇහැටුවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කරන ලද බතික් හා ආශ්‍රිත නිෂ්පාදන පුහුණු පාඨමාලාව සාර්ථක ලෙස නිම කර ඇත.

සහභාගීවූ ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 26 කි.

වියදම - රු.මි. 0.33

– **නව මෝස්තර, ක්‍රියාවලි සහ නිෂ්පාදන සංවර්ධනය තුළින් බතික්, අත්යන්ත්‍ර සහ රෙදිපිළි කර්මාන්තකරුවන් සවිබල ගැන්වීම.**

ජාතික මෝස්තර මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව 2024 වසරතුළ දී පුහුණු වැඩසටහන් 12 ක් පවත්වා ඇත.

වියදම - රු.මි. 2.88.

– **ශිල්ප අභිමානී ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත සම්මාන ප්‍රදානය**

ජාතික ශිල්ප සභාව මගින් පවත්වන ලද ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරඟය සහ ප්‍රදර්ශනය "ශිල්ප අභිමානී - 2023" හි උපචිත වියදම් පියවීම සඳහා දායකත්වය ලබාදෙන ලදී.

වියදම - රු.මි. 7.06

– **බතික්, අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්තවල නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගිකරණය තුළින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය සමග ඒකාබද්ධව බතික් හා අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදකයින් 400 දෙනෙකු ව්‍යවසායකයින් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 20 ක් පවත්වා ඇත.

වියදම - රු.මි. 10.55

- **අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම (රු.මි. 300)**

– **ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නිරත කාන්තාවන් හා තරුණ ප්‍රජාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම**

පේෂකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනයේ සහභාගිත්වය ඇතිව දැනට අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තයේ නියැලී සිටින කර්මාන්තකරුවන් 496 දෙනෙකු සඳහා පෙර ඉගෙනුම් පදනම් කරගනිමින් ජාතික වෘත්තීය සහතික පත්‍ර ලබා දීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.

එහිදී ප්‍රතිලාභියාගේ ධාරිතාවය මත පදනම්ව ජාතික වෘත්තීය සුදුසුකම් අදියර III හෝ IV මට්ටමේ සහතික අදාළ ප්‍රතිලාභීන් වෙත ලබාදීමට කටයුතු සිදු කරන ලදි.
වියදම - රු.මි. 5.235

– **නිෂ්පාදන විවිධාංගීකරණය, නව මෝස්තර, නව තාක්ෂණ භාවිතය හා ව්‍යවසායකත්ව කුසලතා ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ මෙහෙයවීම හා මෙම අංශයේ ප්‍රතිපාදන මත "Brain into Business" වැඩසටහන මඟින් අත්යන්ත්‍ර රෙදිපිළි හා ඇඟළුම් ක්ෂේත්‍රයේ නිරත උපාධිධාරීන් 10 දෙනෙකුගේ ව්‍යවසායකත්ව කුසලතා වැඩිදියුණු කිරීම හා ඔවුන් රැකියා වෙළඳපොල තුළ රැකියා සොයන්නන් ලෙස නොව රැකියා උත්පාදනය කරන්නන් ලෙස ජාතික ආර්ථික ප්‍රවාහයට ඒකාබද්ධ කිරීම මෙම වැඩසටහන යටතේ සිදුකරන ලදී.
වියදම - රු.මි. 3.55

– **අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාදාමය සිදුකිරීම**

බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා දේශීය අමුද්‍රව්‍ය උපයෝගිකොට ගනිමින් ස්වභාවික වර්ණක හඳුන්වා දීම මෙම වැඩසටහන මඟින් සිදුකරන ලද අතර, ඒ සඳහා වූ පර්යේෂණ සහ තාක්ෂණ දායකත්වය SLINTEC ආයතනය මඟින් සපයා ගන්නා ලදී.
වියදම - රු.මි. 2.07

– **දේශීය අත්යන්ත්‍ර රෙදිපිළි හා බතික් නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම**

පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද "ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය අලෙවි සල්පිල හා සම්මාන ප්‍රදානෝත්සවයේ" විද්‍යුත් මාධ්‍ය වෙළඳ ප්‍රචාරණ කටයුතු සිදුකරන ලදී.
වියදම - රු.මි. 3.844

- **මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම**

– මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය මෙම වර්ෂයේදී උපයාගෙන ඇති අපනයන ආදායම ඇමරිකන් ඩොලර් මිලියන 354.55 කි.

– ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරුව යටතේ ඉංගිරිය, දෙහිඕවිට, අයගම හා පැල්මඩුල්ල ප්‍රදේශවල නව මැණික් නිධි හඳුනා ගැනීම 85% ක් අවසන් කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුණතාවය ඉහළ නැංවීම සඳහා පවත්වන පාඨමාලා වලට සිසුන් 1335 ක් බඳවා ගෙන ඇති අතර, ඉන් සිසුන් 507 ක් පාඨමාලා අවසන් කර ඇති අතර, සිසුන් 746 ක් පාඨමාලා හදාරමින් සිටී.

- රත්නපුර ජාත්‍යන්තර මැණික් හා ස්වර්ණාභරණ වෙළඳ මධ්‍යස්ථානය මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් සඳහා විවෘත කරන ලදි.

- සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණ කර්මාන්තකරුවන් නඟා සිටුවීමේ වැඩසටහන යටතේ තෝරාගත් ස්වර්ණාභරණ සංගම් සඳහා ස්වර්ණාභරණ කට්ටල් 60 ක් ලබා දී ඇත.

- දේශීය හා විදේශීය මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ස්වර්ණාභරණකරුවන් 124 දෙනෙකු සහභාගි කරවා ඇත.

- මැණික් සහ ස්වර්ණාභරණ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාලව 2024 වර්ෂයේ ලැබුණු පැමිණිලි 60 න් 24 ක් සඳහා පිළිතුරු සපයා ඇති අතර ඉතිරි පැමිණිලි සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කරමින් පවතී.

- 2024 වර්ෂයේදී වන විට මැණික් කැණීම් සම්බන්ධයෙන් අභියාචනා 23 ක් ලැබී ඇති අතර, ඉන් 06 ක් විභාග කර අවසන් කර ඇත.

- විදේශිකයින් විසින් අනවසරයෙන් සිදු කරන මැණික් වෙළඳාම පාලනය කිරීමේ අරමුණින් ඒ සඳහා වන යාන්ත්‍රණයක් සකස් කර ඇති අතර, එකී ක්‍රමවේදය 2025 පෙබරවාරි මස සිට ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට නිපුණ ශ්‍රමය සහ නව තාක්ෂණික දැනුම ලබා ගැනීම සඳහා තායිලන්තයේ මැණික් හා ස්වර්ණාභරණ සංගමය හා ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, එහි කටයුතු සිදු කෙරෙමින් පවතී.

අභියෝග

- බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි හා පාරම්පරික හස්ත කර්මාන්ත ඇතුළු දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් සඳහා අවශ්‍ය අවස්ථාවන් හි දී මූල්‍ය පහසුව ළඟාකරගැනීම සඳහා සුවිශේෂී වූ ක්‍රමවේදයක් නොමැති වීම.
- ඉහත කර්මාන්තකරුවන් සඳහා ආනයනික අමුද්‍රව්‍ය ලබා ගැනීමේ දී ඉහළ වෙළඳපොල පිරිවැයක් දැරීමට සිදුවීම.
- කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය කැනීම, කැපීම හා ප්‍රවාහනයේ දී සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළයුතු වීම හා එකී රාජ්‍ය ආයතන අතර සම්බන්ධීකරණය අවම මට්ටමක පැවැතීම තුළින් කර්මාන්තකරුවන් අපහසුතාවයන්ට ලක්වීම
- අධික විදුලි වියදම හේතුවෙන් කර්මාන්තයන්හි නිෂ්පාදන පිරිවැය ඉහළ යාම.
- රජය විසින් පනවා ඇති නව බදු නිසා කර්මාන්තකරුවන් අධෛර්යයට පත් වී සිටීම
- මැණික් සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් වී නොතිබීම.

- මැණික් සම්පත පරිපූර්ණ ලෙස තිරසර ලෙස භාවිතය සඳහා ගැනීමට නොහැකිවීම.
- විදේශ විනිමය නීත්‍යානුකූල ක්‍රමවේදයකට රට තුළට ගලා නොඒම.
- මැණික් සම්පත තිරසර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම.
- මැණික් කැපීම හා ඔපදැමීමේ නිපුණතාවයෙන් යුත් ශ්‍රම බලකායක් නොමැති වීම.
- පුහුණුලාභීන්ගේ දැනුම හා ශිල්පීය නිපුණතාවයට ගැළපෙන පරිදි වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීමේ ක්‍රමවේදයක් කර්මාන්තය තුළ නොමැති වීම හේතුවෙන් කර්මාන්තය සඳහා යොමු වන පුහුණුලාභීන්ට එය සෘණ බලපෑමක් එල්ල කිරීම.

ඉදිරි සැලසුම්

- **දැව නිෂ්පාදන ආශ්‍රිත නිර්මාණ හා මෝස්තර මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු පුළුල් කිරීම**

  දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා නවීන තාක්ෂණය, නව මෝස්තර, පර්යේෂණ හා නවෝත්පාදන යන අංශවල වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් 2021 වසරේ ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘතිය 2025 වසරේ දී ද තවදුරටත් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

  එහිදී පළාත් මට්ටමෙන් හඳුනාගන්නා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්තයේ නිරත වෘත්තිකයින්ගේ හා ආධුනිකයන්ගේ (වසරකට ආසන්න වශයෙන් 40 පමණ) උසස් වෘත්තීය පුහුණු අවශ්‍යතාවන් මෙමඟින් සපුරාලීමට අපේක්ෂා කෙරේ.

- **ග්‍රාමීය කර්මාන්ත සඳහා දේශීය හා විදේශිය වෙළඳපොල ප්‍රවර්ධන වැඩසටහන**

  කුඩා හා මධ්‍ය පරිමාණ ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ නිෂ්පාදන සඳහා දේශීය හා විදේශීය වෙළඳපොල අවස්ථා උදාකර දීම අරමුණු කරගනිමින් 2021 වසරේ ආරම්භ කරන ලද මෙම වැඩසටහන 2025 වසරේදී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

  දේශීය නිෂ්පාදන සම්බන්ධයෙන් පාරිභෝගිකයන් අතර දැනුවත්භාවය ඉහළ නැංවීම ,නව නිෂ්පාදන, නව මෝස්තර සහ තාක්ෂණය සම්බන්ධ දැනුම හුවමාරු කර ගැනීම සඳහා අවස්ථා උදාකර දීම හා දේශීය විදේශීය අලෙවි අවස්ථාවන් උදාකර දීම තුළින් ග්‍රාමීය කර්මාන්තකරුවන්ගේ ආදායම් ඉහළ නැංවීමට හා ඔවුන්ගේ ජීවන තත්වය නඟාසිටුවීම ව්‍යාපෘතිය අපේක්ෂා කරයි.

- **ග්‍රාමීය කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය වගාකිරීමේ වැඩසටහන**

  2021 වසරේ දී ආරම්භ කරන ලද හස්ත කර්මාන්ත සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ශාක වගා කිරීමේ වැඩසටහන 2025 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- **බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත සඳහා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

  දේශීය විශ්වවිද්‍යාල හා පර්යේෂණ ආයතන සමඟ ඒකාබද්ධව බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි නිෂ්පාදන කර්මාන්තය සඳහා ස්වභාවික වර්ණක හඳුනාගැනීමටත්, ඒවා වාණිජකරණය කිරීමේ වැඩපිළිවෙල සඳහා යොමුවීමටත් කටයුතු සැලසුම් කර ඇත.

- **බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් නිෂ්පාදන ප්‍රවර්ධන/ වෙළඳපොළ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
  බතික්, අත්යන්ත්‍ර රෙදිපිළි හා දේශීය ඇඟළුම් ප්‍රචලිත කිරීම සඳහා විලාසිතා නිර්මාණ තරඟ, විලාසිතා දැක්ම, ප්‍රදර්ශන හා පුහුණු වැඩසටහන් මේ යටතේ සිදුකිරීමට සැලසුම් කර ඇත.

- **බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සංවර්ධනය.**
  පළාත් කර්මාන්ත අමාත්‍යාංශ යටතේ ක්‍රියාත්මක වන පළාත් පේෂකර්මාන්ත දෙපාර්තමේන්තු සතු පුහුණු මධ්‍යස්ථාන හා නිෂ්පාදන මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මෙහිදී සිදුකිරීමට අපේක්ෂිතය.

- **අපනයනය ඉලක්ක කරගත් නිෂ්පාදන දිරිගැන්වීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**
  ඇඟළුම් නිෂ්පාදනයේ නිරත මැහුම්කරුවන්ගේ කුසලතා තක්සේරු කරමින් ඔවුන් සඳහා වෘත්තීය සහතික පත් ලබාදීම හා ගෝලීය වෙළෙඳපොළට හඳුන්වා දීම මෙම වැඩසටහන මඟින් සිදුකෙරේ.

- මැණික් හා ස්වර්ණාභරණ අපනයන ආදායම් 2024 වර්ෂයට සාපේක්ෂව දෙගුණයකින් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම.

- ජාත්‍යන්තර මට්ටමේ මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශනයක් ශ්‍රී ලංකාවේදී පැවැත්වීමට අපේක්ෂිතය.

- ශ්‍රී ලංකාවේ නව මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ඒකාබද්ධ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පසුබිම නිර්මාණය කිරීම.

- ශ්‍රී ලංකාව කලාපීය මැණික් මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා ලංකාවේ හමු නොවන මැණික් වර්ගද සමඟින් මැණික් සංචිතය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම.

- මැණික් තාපකරණය, අගය වැඩි කිරීම හා රසායනාගාර පහසුකම් ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම සඳහා පසුබිම සකස් කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ ව්‍යවසායකයින් බිහි කිරීම සඳහා අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීම.

- මෙම ක්ෂේත්‍රයේ ප්‍රවණතාවයන්ට සරිලන පරිදි වෘත්තීය පුහුණු පාඨමාලා සඳහා නව පුහුණු මධ්‍යස්ථාන ස්ථාපනය කිරිමට අපේක්ෂිතය.

- වටිනාකම අඩු කුඩා ප්‍රමාණයේ මැණික් ශ්‍රී ලංකාව තුළ කපා ඔප දැමීමේ තාක්ෂණය ඇතුළත් පුහුණු ඒකකයක් ස්ථාපනය කිරීම.

- ක්ෂේත්‍රයේ නිරත පුද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ විධිමත් සම්බන්ධීකරණ යාන්ත්‍රනයක් ඇති කිරීම.

- අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතනයන්හි අණ පනත් හා ගැසට්, කාලීන අවශ්‍යතාවය පරිදි සංශෝධනය කිරීම.

- මැණික් අපනයනය සඳහා නව වෙළඳපොලවල් හඳුනාගැනීම හා එම වෙළඳපොලවල් සමඟ ගිවිසුම් ගත වීම.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ සංවර්ධනය සඳහා පොදු ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීම.

- විදේශිකයින් විසින් දේශීයව මැණික් මිලදීගෙන අපනයනය කිරීම විධිමත් කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම.

2.9 රාජ්‍ය ව්‍යවසායයන් සහ අනෙකුත් ආයතන

2.9.1 කාර්මික සංවර්ධන මණ්ඩලය

ප්‍රගතිය/ ජයග්‍රහණ

භෞතික ප්‍රගතිය

- 2024 වසර තුළ තාක්ෂණික ප්‍රගතිය සහ නව තාක්ෂණික ක්‍රමවේද වෙත අවතීර්ණ වීම ප්‍රවර්ධනය කරනු ලැබූ ව්‍යවසායකයින් සංඛ්‍යාව 3,182කි.
- මෙම වර්ෂය තුල ව්‍යවසායකයින් 1,665කට කළමනාකරණ කුසලතා සංවර්ධනය කරන ලදි.
- කර්මාන්ත 397කට මූල්‍ය විශ්වසනීයතාව සහ මූල්‍ය ප්‍රවේශය (මූල්‍ය සහ ආයෝජන ලෙස) සහතික කරන ලදි.
- දේශීය නිෂ්පාදන සඳහා දේශීය සහ ගෝලීය වෙළඳපල ප්‍රවේශය පුළුල් කරන ලදි (දේශීය – 674, ගෝලීය – 65).
- කර්මාන්ත 423ක් වෙත කර්මාන්ත පිහිටුවීමට සහ ඒවා වර්ධනය කිරීමට අනුකූල නීතිමය සහ නියාමන පාරිසරික තත්වය සහතික කරන ලදී.
- ව්‍යවසායකයින් 41 ක් වෙත කාර්යක්ෂමව ව්‍යාපාරික කටයුතු පවත්වාගැනීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ශක්තිමත් කරන ලදි.
- තාක්ෂණික පුහුණු වැඩසටහන් 690 ක් පැවැත්වූ අතර, ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 11,509 කි.
- කළමනාකරණ කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහන් 133 ක් පැවැත්වූ අතර, ප්‍රතිලාභ ලැබූ සංඛ්‍යාව 3,284 කි.
- කර්මාන්තකරුවන් 405ක් වෙත ඉංජිනේරු සේවා සැපයීම.

මූල්‍ය ප්‍රගතිය

- 2024 වර්ෂය සඳහා පුනරාවර්තන සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා මුළු වෙන් කිරීම පිළිවෙලින් රු. මි. 450 ක් සහ රු. මි. 50 ක් විය. 2024 දෙසැම්බර් 31 වන විට පුනරාවර්තන හා අනෙකුත් පුනරාවර්තන වියදම්වලින් 100%ක් වන ලෙස වියදම් කර ඇත.
- සංවර්ධන ක්‍රියාවලියන් සඳහා වෙන් කරනු ලැබූ වාර්ෂික මුදල රු. මි. 11.3ක් වන අතර, එය වසර අවසානය වන විට දී 100%ක් වියදම් කර ඇත.
- අදාළ වර්ෂය සඳහා ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීම සඳහා රු. මි. 88.7 ක මුදලක් වෙන් කරනු ලැබූ අතර, එය 100%ක් ප්‍රාග්ධන අයවැය හරහා වියදම් කර ඇත.
- දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා වෙන් කළ මුළු මුදල රු. මි. 100ක්,වන අතර 2024 දෙසැම්බර් 31 වන දින වන විට එම ව්‍යාපෘති සඳහා 100%ක් වියදම් කර ඇති අතර එයට ගෙවිය යුතු මුදල රු. මි. 41 ක් පමණ වේ.

ආයතනික අභියෝග

- දේශීය කර්මාන්ත සඳහා ගෝලීය වෙළඳපොළට ළඟා වීමට සීමිත වෙළඳපොළ අවස්ථා
  - අපනයන වෙළෙඳපොළ සබඳතා ගොඩනඟා ගැනීමට සහ නවීන තාක්ෂණය මෙරටට ගෙන ඒම සඳහා විදේශ තානාපති කාර්යාලවල සේවය ලබා ගැනීම අවශ්‍ය වේ.
  - ගෝලීය වෙළෙඳපොළ වෙත ළඟාවීම සඳහා අපනයන ඉලක්ක සහිත විදේශීය තානාපති කාර්යාල වෙත KPIs ලබා දීම අවශ්‍ය වන අතර එමඟින් දේශීය කර්මාන්ත ඉහළ නැංවීම සඳහා විශේෂ අවධානයක් යොමු කරමින් දේශීය ව්‍යවසායකයින් ආරක්ෂා කිරීම, ආරක්ෂා කිරීම සහ ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.
  - දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ට ගෝලීය වෙළෙඳපොළට ළඟා වීමට බාධාවක් වන තාක්‍ෂණික හිඩැස්වලට විසඳුම් සෙවීම අවශ්‍ය වේ.
  - හිතකර ආර්ථිකයන් (FTAs) සමඟ නව ආර්ථික හවුල්කාරිත්වයන් නොමැති වීම හේතුවෙන් ගෝලීය වෙලඳපොල වෙත ළඟා වීමට ඇති බාධක ආමන්ත්‍රණය කිරීම අවශ්‍ය වේ.

- පරිපාලන ක්‍රියා පටිපාටි ලිහිල් කිරීමෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් අපනයනයට ඇතුළු වීමට පහසුකම් සැලසීම අවශ්‍ය වේ.
  - සංවර්ධන වැඩසටහන් සඳහා පවතින අරමුදල් සීමිත / ප්‍රමාණවත් නොවීම.
  - නව කර්මාන්ත පිහිටුවීම සඳහා පවතින භූමිය ප්‍රමාණවත් නොවීම.

- නව ආයතන සහ ආයෝජන සඳහා අවස්ථා පුළුල් කිරීම සඳහා සෑම දිස්ත්‍රික්කයකින්ම මුළු භූමි ප්‍රමාණයෙන් 1%ක් ලබාගෙන ඒවා ඩිජිටල් ඉඩම් බැංකුවක් ලෙස මාර්ගගතව ලබා දීමෙන් කර්මාන්ත කලාපවලට අයත් භූමි ප්‍රමාණය පුළුල් කිරීම අවශ්‍ය වේ.

- නවීන තාක්ෂණය සමඟ යටිතල පහසුකම් ශක්තිමත් කිරීම අවශ්‍ය වේ.
    - කර්මාන්ත සඳහා භූමිය ලබා ගැනීමට හා භූමිය පුළුල් කිරීමට බාධා වන ලෙස ඉහළ නීතිමය රාමුවක් පැවතීම.
    - නව තාක්ෂණික පුනරුදයක් වෙත ව්‍යාපාර නැඹුරු වීමට යාමේදී මූල්‍යමය දුෂ්කරතා පැවතීම.
    - මිනිස් සම්පත් සංවර්ධනය සඳහා මූල්‍යමය දුෂ්කරතා පැවතීම.
    - අපනයන වෙළඳපල පුළුල් කිරීම සඳහා බාධාවන් පැවතීම.
    - දේශීය වෙළඳපල පුළුල් කිරීම සඳහා වන බාධාවන්.

ඉදිරි සැලැසුම්

- හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්මික නගර ව්‍යාපෘතිය.
- පළාත් 09 ක ඉන්කියුබේටර් පිහිටුවීමේ ව්‍යාපෘතිය.
- දිවයිනේ සියලුම මැතිවරණ කොට්ඨාශ ආවරණය වන පරිදි නව ව්‍යාපාර 196ක් ස්ථාපිත කිරීම.

- සියලුම දිස්ත්‍රික්කවල අලෙවි මධ්‍යස්ථාන 25ක් ස්ථාපිත කිරීම.
- ප්‍රති ඉංජිනේරුකරණයට සහාය ලබාදීම මගින් ආනයන ආදේශන කර්මාන්ත පිහිටුවීම.
- Clean Sri Lanka වැඩසටහන යටතේ ආහාර සුරක්ෂිතතාව සඳහා සහාය වන ව්‍යාපෘතිය.
- පාසල් ළමුන් අතර මන්දපෝෂණය තුරන් කිරීමේ අරමුණින්, ශිෂ්‍යයන්ට පෝෂණීය ආහාර පැකේජ ලබාදීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කටයුතු කිරීම.

2.9.2 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

ප්‍රගතිය/ ජයග්‍රහණ

- උපාධිධාරී තරුණ ව්‍යවසායකයින් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීම පිණිස ක්‍රියාත්මක කරන "Brain into Business" "උපාධිධාරී ව්‍යවසායක උදානය" වැඩසටහන රජයේ විශ්ව විද්‍යාල සම්බන්ධකර ගනිමින් සිදුකරයි. මේ තුලින් 2024 වර්ෂයේ උපාධි හදාරනන් 367 දෙනකු ව්‍යවසායකත්වය සම්බන්ධව පුහුණුව ලැබූ අතර 31 දෙනකු සාර්ථක ව්‍යවසායකයින් බවට පත්කරන ලදී.

- තරුණ වෘත්තීය පුහුණු ලාභීන් ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමු කිරීමේ අරමුණ ඇතිව 2024 වර්ෂයේදී තරුණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීමට හැකියාව ලැබුණි. ලංකාවේ වෘත්තීය පුහුණු ආයතන සමග ක්‍රියාත්මක වන මෙම වැඩසටහන දීපව්‍යාපත්ව වෘත්තීය පුහුණු ලාභීන් වෙත අවස්ථාව ලබා දීම මෙම වැඩසටහනින් සැලසුම් කරයි. පුහුණුව, මූල්‍ය පහසුකම් ලබාදීම මෙන්ම අවශ්‍ය මගපෙන්වීම මෙම වැඩසටහන තුලින් ලබාදෙන අතර මෙම තරුණ කණ්ඩායම් සාර්ථක ව්‍යවසායයන් බවට පත්කිරීම මේ වැඩසටහන තුලින් සිදුකරයි. 2024 වර්ෂයේදී වෘත්තීය පුහුණු ලාභීන් 144 දෙනකු සඳහා පුහුණුව ලබා දුන් අතර 32 දෙනකු ව්‍යවසායකයින් බවට පත් කරන ලදී.

- අධිකාරියට අඩුපාඩුවක්ව තිබූ අංග සම්පූර්ණ දේශන ශාලාවක් 2024 වර්ෂයේදී සාදා නිමකිරීමට හැකියාවක් ලැබුණි. මෙය වැඩි වශයෙන් ආයතන හා පුද්ගල අනුග්‍රාහකත්වය ඇතිව මෙම අංග සම්පූර්ණ දේශන ශාලාව සාදා නිමකිරීමට හැකියාව ලැබුණි.

- පුහුණු ආයතනයක් වශයෙන් තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ (TVEC) සහතික ලත් ආයතනයක් බවට පත්වීම.

- ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නොවන සංවිධාන සහ වෙනත් අනුග්‍රාහක ආයතන සමග කටයුතුකරමින් අවශ්‍ය මූල්‍ය දායකත්වය ලබාගනී. 2024 වර්ෂයේ විවිධ සංවර්ධන වැඩසටහන් සඳහා මූල්‍ය දායකත්වයක් ලබා ගැනීමට හැකියාව ලැබුණු අතර මෙම ආයතන සමග ඒකාබද්ධ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමටද හැකියාව ලැබුණි (ILO. ADB, Word bank, Jica etc.)

- ප්‍රථම වතාවට විදේශිකයින් ඉලක්ක කරගත් දැවැන්ත අළෙවි ප්‍රදර්ශනයක් ඇල්ල ප්‍රදේශයේදී පැවැත්වීමට අධිකාරියට හැකියාව ලැබුනි. වෙළඳ කුටි සියයකට අධික ප්‍රමාණයකින් සමන්විත වූ මෙම ප්‍රදර්ශනය ILO අනුග්‍රාහකත්වය සමග ඉතා සාර්ථකව සිදු කිරීමට හැකියාව ලැබුණි.

- අඩපණවී තිබූ මාකදුර ප්‍රදේශයේ තිබූ පෙරවැඩුම මධ්‍යස්ථානය (Incubation Center) නැවත ක්‍රියාත්මක තත්වයට පත් කිරීමට හැකියාව ලැබූ අතර දැනට ඉලක්ක කණ්ඩායම් වෙත අවශ්‍ය සේවා සපයමින් පවතී.

- ව්‍යවසායකයින්ගේ වෙළඳ සන්නාමයන් සංවර්ධනය සඳහා වූ B500 සන්නාම සංවර්ධන වැඩසටහන ආරම්භ කිරීමට 2024 වර්ෂයේදී හැකියාව ලැබුණි. මේ තුලින් ව්‍යවසායකයින්ගේ සන්නාම සංවර්ධනය සඳහා අවශ්‍ය මගපෙන්වීම හා පහසුකම් සැලසීම සිදුවේ.

- 2024 වර්ෂයේදී වෙළඳ ප්‍රදර්ශන 8ක් (බදුල්ල, මාවනැල්ල, ත්‍රිකුණාමලය, මඩකලපුව, ගම්පහ, කැලණිය, හම්බන්තොට සහ කළුතර) පවත්වන ලද අතර ව්‍යවසායකයින් 427 ක් සඳහා පහසුකම් සපයන ලදී.

- වයඹ, උතුරු මැද, සබරගමුව සහ බස්නාහිර පළාත්වල ප්‍රාදේශීය ව්‍යවසායක සම්මාන උළෙලවල් 4ක් පවත්වන ලදී.

- ප්‍රාදේශීය ව්‍යවසායකයින් 48672 දෙනකු සඳහා තාක්ෂණික, ව්‍යවසායකත්ව, මූල්‍ය කළමනාකරණය, අලෙවිකරණය වැනි පුහුණු අවස්ථා ලබාදුන් අතර මේ තුලින් නව ව්‍යවසායයන් 1304 ක් බිහි වූ අතර ව්‍යාපාර 1737 ක් පුළුල් කරන ලදී.

- අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන ව්‍යාපාර පර්ෂද සංවර්ධන වැඩසටහන තුලින් පර්ෂද සමිති 67ක් පිහිටුවන ලද අතර ඒ තුලින් ව්‍යවසායකයින් 555 ක් සංවර්ධනය කරන ලදී.

- 2024 වර්ෂයේ දී ව්‍යවසායකයින් 41ක් සඳහා “Made in Sri Lanka” ලාංඡනය පිරිනමන ලදී.

ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යාපාර ක්ෂේත්‍රයේ පවතින අභියෝග

- ව්‍යවසාය සංවර්ධන සේවයන් සපයන්නා වූ විවිධ රාජ්‍ය ආයතනයන්හි සේවාවන් මෙන්ම ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වන විවිධ සංවර්ධන වැඩසටහන්/ව්‍යපෘති අධීක්ෂනය හා නියාමනය කිරීමට විධිමත් නියාමන රාජ්‍ය ආයතනයක් නොතිබීම.
  රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය මෙන්ම මූල්‍ය ආයතන ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා පොදු අර්ථ දැක්වීමක් භාවිතයට නොගන්නා අතර සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමේ දී ඔවුන් විවිධ අර්ථ දැක්වීම් යොදා ගැනීම නිසා පොදු සැලසුම්කරණයේදී එය බාධාකාරී වීම. (කර්මාන්ත අමාත්‍යාංශය මගින් මේ වන විට විධිමත් අර්ථ දැක්වීමක් සකසා ඇත)

- ව්‍යවසාය සංවර්ධනය සඳහා වූ නීති රෙගුලාසි හා අදාල ප්‍රතිපත්තීන් නිරන්තරයෙන් අවිධිමත් ලෙස වෙනස් වීමට ලක්වීම තුල ව්‍යවසායකයන් අපහසුතාවයට ලක්වනවා මෙන්ම රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන වැඩසටහන් සැළසුම්කරණයට හා ක්‍රියාත්මක කිරීමට බාධාකාරීවීම.

- නව ව්‍යවසායයන් ආරම්භ කිරීම, පවත්වාගැනීම මෙන්ම පුළුල් කිරීම සඳහා වූ අවශ්‍ය ලියාපදිංචි කිරීම, අවශ්‍ය බලපත්‍ර ලබා ගැනීම, තත්ව සහතික වැනි නීතිමය අවශයතා ඉටුකර ගැනීමේ දී පවතින අකාර්යක්ෂමතාවය හා පවතින දැඩි නීති රෙගුලාසි ව්‍යාපාර සංවර්ධනය සඳහා අයහපත් පරිසරයක් නිර්මාණය කර තිබීම.

- ජාතික මෙන්ම ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායක ප්‍රශ්න/ගැටළු හඳුනාගැනීමට මෙන්ම විසඳුම් කරා යාමට, විවිධ ව්‍යාපාරික ක්ෂේත්‍රයන් නියෝජනය කරන ව්‍යවසායකයින් මෙන්ම රාජ්‍ය/පෞද්ගලික ව්‍යාපාර සංවර්ධන සේවා සපයන්නන් සම්බන්ධ වන ව්‍යවසායක සංසද ක්‍රියාත්මක නොවීම හා ඒ හරහා ව්‍යවසායකයින්ගේ ප්‍රශ්න/ගැටළු විසඳීමේ පැහැදිලි යාන්ත්‍රණයක් වර්තමානයේ නොපැවතීම (අමාත්‍යාංශය ක්‍රමවේදයක් සකස් කරමින් පවතී).

- ව්‍යාපාර සංවර්ධනය සඳහා ඵලදායී සේවාවන් ලබාගත හැකි ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් ව්‍යවසායයන් නියෝජනය කරන වාණිජ මණ්ඩල සංවර්ධන වැඩසටහන් සඳහා දායක කර ගැනීම අවම මට්ටමක පැවතීම සහ ඔවුන් සඳහා අවශ්‍ය පහසුකම් ලබා නොදීම.

- දේශීය නිෂ්පාදන සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොළ අවස්ථා උදා කරදීම සඳහා වූ විධිමත් වැඩ පිළිවෙලක් සහිත යාන්ත්‍රණයක් නොපෙන්වීම.

- ලංකාවේ ක්ෂුද්‍ර, සුළු හා මාධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය ඉලක්ක කරගත් පර්යේෂණ හා අධ්‍යයන අවම මට්ටමක පැවතීම මෙන්ම විශ්ව විද්‍යාල ඇතුළු ආයතන තුළින් අධ්‍යයන වාර්තා ප්‍රයෝගිකව යොදා ගැනීමේ අඩු ප්‍රවනතාවය.

- ව්‍යවසාය සංවර්ධනය ඉලක්ක කරගත් රාජ්‍ය පෞද්ගලික අන්තර් සම්බන්ධතා තුළින් අදහස් හුවමාරුව හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අවම මට්ටමක පැවතිම.

- වර්තමාන තාක්ෂණික වෘත්තීය පුහුණු පාඨමාලා ව්‍යාපාරික ක්ෂේත්‍රයට යොමුවීමට අවශ්‍ය ප්‍රයෝගික ක්‍රියාකාරකම් ඇතුළත් ව්‍යවසායකත්වය සම්බන්ධ විෂය කොටස් අන්තර්ගත නොවීම තුළ එය රැකියා අවස්ථාවන්ට පමණක් සීමා වීම.

- ව්‍යවසායකත්ව සංවර්ධන සේවාවන් සපයන රාජ්‍ය ආයතන අතර පවතින අනවශ්‍ය තරඟකාරිත්වය සමග ස්වාධීන අරමුණු හා සැලසුම් ක්‍රියාත්මක කිරීම මිස සාමූහික අරමුණු හා සැලසුම් ගොඩනැගී නොතිබීම.

අභියෝග

- අධිකාරියේ ප්‍රධාන කාර්යාලය මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල රාජකාරි කටයුතු කරන නිලධාරීන්ගේ හිඟය ප්‍රධාන ගැටළුවක් වී ඇති අතර මේ තුළින් සංවර්ධන වැඩසටහන් නිසි අයුරින් සිදුකිරීමට අපහසු වී ඇත. සියලු දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාල වල නිලධාරීන් සිටිය යුතු වුවද දැනට මෙම සංවර්ධන නිලධාරීන් 298 ක් පමණක් රාජකාරී කටයුතු සිදු කරයි. ප්‍රධාන කාර්යාලයේ පවතින නිලධාරී පුරප්පාඩුව ද ප්‍රධාන ගැටලුවකි.

- අධිකාරිය මගින් වාර්ෂික සංවර්ධන වැඩසටහන් සැලසුම් කර ඒ සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටියද වාර්ෂිකව අධිකාරිය වෙත වෙන්කරන හා සැලසුමට අනුව ලැබෙන ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම සහ නිසි කලට නොලැබීම සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පවතින ප්‍රධාන බාධාවකි.

- අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා මෙන්ම ප්‍රාදේශීය නිලධාරීන් සඳහා ගෙවිය යුතු පුනරාවර්තන වියදම් ප්‍රමාණවත් නොවීම් .

ඉදිරි සැලසුම්

- ග්‍රාමීය ව්‍යවසායන් සඳහා මාර්ග ගත අලෙවිකරණය සම්බන්ධව අවශ්‍ය දැනුම කුසලතා සංවර්ධනය, සමාජ මාධ්‍ය මෙන්ම ඩිජිටල්කරණය තුලින් ග්‍රාමීය ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන සඳහා අළෙවි අවස්ථා උදාකර දීම.
- “Brain in to Business” වැඩසටහන තව දුරටත් පුළුල්කර උපාධිධාරීන් සහ වෘත්තීය පුහුණු ලාභීන් ව්‍යවසායක ක්ෂේත්‍රයට යොමු කිරීම.
- දේශීය නිෂ්පාදන සඳහා “Made in Sri Lanka” ලාංඡනය ලබා දීමට කටයුතු කිරීම සහ එහි වටිනාකම වැඩි කිරීම.
- ව්‍යවසායක සංවර්ධන ක්ෂේත්‍රයට අදාලව පර්යේෂණ අදාල ආයතන සමග සිදු කිරීමට කටයුතු කිරීම.
- විදේශ විනිමය මෙන්ම රැකියා අවස්ථා ඉලක්ක කරගනිමින් හදුනාගත් ව්‍යාපාරික ක්ෂේත්‍රයන් සංවර්ධනය සඳහා කටයුතු කිරීම.
- ව්‍යවසායයන් වෙත පහසුවෙන් මූල්‍ය පහසුකම් ලබාගැනීම සඳහා අදාල මූල්‍ය ආයතන සමග එකාබද්ධව කටයුතු කරමින් මනා මූල්‍ය සේවාවක් ලබා දීමට පියවර ගැනීම.

2.9.3 ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- උපාධි ප්‍රදානය සඳහා අනුමැතිය ලබා ගැනීම.
- උපාධි පාඨමාලාවේ විෂයධාරාවට අනුමැතිය ලබාගැනීම.
- පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් විදුලිබිල අවම කර ගැනීම.
- ඩිප්ලෝමා පාඨමාලා 5 ක් සඳහා (පූර්ණ කාලීන සහ අර්ධ කාලීන) තෘතීය හා වෘත්තීය පුහුණු අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගැනීම.
- එක්සත් රාජධානියේ පේෂකර්ම ආයතනයේ සාමාජිකත්වය ලබා ගැනීම.
- වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රාග්ධන අරමුදල් මගින් සිදු කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව නිම කිරීම.
- ඒකාබද්ධ අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉන්දියාවේ කුමරගුරු තාක්ෂණ විශ්ව විද්‍යාලය සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීම.
- වර්ෂයේ පුහුණු කිරීම් ඉලක්කයේ 80% මූල්‍ය ප්‍රගතියක් සහ 100% භෞතික ප්‍රගතියක් ලබා ගැනීම.
- කර්මාන්ත අමාත්‍යාංශයේ කුඩා සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන කිරීමේ අංශයේ ප්‍රතිපාදන මත බතික්/අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්තවල නිෂ්පාදන සංවර්ධනය සහ විවිධාංගීකරණය තුළින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධන වැඩසටහන යටතේ පුහුණු පාඨමාලා 20 ක් තුල ව්‍යවසායකයින් 400 දෙනෙකු ගේ කුසලතා සංවර්ධනය කිරීම.
- ළමා ඇඳුම් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂක සහතික කිරීමේ ප්‍රතිපත්ති අත්පොත සහ ක්‍රියා පටිපාටි අත්පොත සකස් කිරීම.

අභියෝග

- පුහුණුව සහ අධ්‍යාපනය අතර පරතරය - කර්මාන්ත අවශ්‍යතා සමග සමපාත වන පරිදි පුහුණු වැඩසටහන් අඛණ්ඩව යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ.
- ගෝලීය තරඟකාරිත්වය - බංගලාදේශය, ඉන්දියාව වැනි රෙදිපිළි සහ ඇඟලුම් අංශයේ අනෙකුත් අඩු වියදම් නිෂ්පාදන රටවලින් තරඟකාරිත්වය වැඩිවීම.
- ඇමරිකා එක්සත් ජනපදය වැනි සමහර රටවල් විසින් ඇඟලුම් නිෂ්පාදන සඳහා ඉහළ බදු අනුපාත පැනවීම.
- පාසල් නිල ඇඳුම් පරීක්ෂණ ව්‍යාපෘතිය අහිමිවීම.
- ක්ෂේත්‍රයේ සුදුසුකම්ලත් විශේෂඥ කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ අපහසුතාවය.
- විශ්‍රාම යාමෙන් ඇතිවන පුරප්පාඩු සඳහා බඳවාගැනීමේ අපහසුතාවය.

ඉදිරි සැලසුම්

- පේෂකර්ම සහ ඇඟලුම් පිළිබඳ විද්‍යාවේදී උපාධිය (Bsc in Textile and Apparel), තාක්ෂණවේදී උපාධිය (B-Tech) සහ විලාසිතා නිර්මාණකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (Bsc in Fashion Design) යන උපාධි පාඨමාලා තුන ආරම්භ කිරීම.
- සියලුම ඩිප්ලෝමා සහ උසස් ජාතික ඩිප්ලෝමා NVQ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම.
- පුස්තකාලය, ශ්‍රවණාගාරය සහ විලාසිතා නිර්මාණ මැදිරිය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම.
- පුහුණු, උපදේශන, පරීක්ෂණ සහ තාක්ෂණික සේවා ක්ෂේත්‍රවල තරඟකාරී සේවා සැපයීම සඳහා ජාත්‍යන්තරව සහ ආයතනික සහ ආයතනික සම්බන්ධතා සහ ජාලකරණ පහසුකම් වැඩිදියුණු කිරීම.
- විදේශීය අධ්‍යයන ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම.
- පර්යේෂණ සංවිධානය කිරීම, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පැවැත්වීම වැනි පර්යේෂණ කටයුතු පුළුල් කිරීම.
- යෝජිත රසායනාගාර පහසුකම් පුළුල් කිරීම.
- ළමා ඇඳුම් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂක සහතිකය.
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සහතික කිරීම ලබා දීම.
- පර්යේෂණ කාර්යාලයක් ස්ථාපිත කිරීම.
- කාබන් පියසටහන් දත්ත පදනමක් ස්ථාපිත කිරීම.
- සුනිත්‍ය බලශක්ති විසඳුමක් ක්‍රියාත්මක කිරීම.
- භෞතික පන්ති කාමරයක් ස්ථාපිත කිරීම.
- පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පද්ධතිය (CRM) සහ පාරිභෝගික විමසීම් අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.

2.9.4 ජාතික ශිල්ප සභාව

ප්‍රගතිය/ ජයග්‍රහණ

- ලියාපදිංචි කරන ලද හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව -1248
- නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව - 840
- පිහිටුවනු ලැබූ ශිල්ප සමාජ සංඛ්‍යාව - 19
- ශිල්පීය පුහුණු ව්‍යාපෘතිය මගින් පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව - 761
- සංවර්ධනය කළ හා උපකරණ ලබා දුන් ශිල්පීය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සංඛ්‍යාව - 07
- ශිල්ප සුහසාධන වැඩසටහන මගින් මාසික දීමනා ලබා දුන් ප්‍රතිලාභී ශිල්පීන් සංඛ්‍යාව - 53
- අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන යටතේ වගා කළ අක්කර ප්‍රමාණය - අක්.17 රූඩ්.02 පර්. 10
- දේශීය හා විදේශිය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පළාත් / දිස්ත්‍රික් අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව - දේශීය 05, විදේශිය 03
- “ශිල්ප අභිමානී” හස්ත කර්මාන්ත තරඟය - පලාත් මට්ටමින් ජයග්‍රහණ ලැබූ ශිල්පීන් සංඛ්‍යාව - 2060
- “ශිල්ප අභිමානී” ජනාධිපති සම්මාන හස්ත කර්මාන්ත තරගය - ජාතික මට්ටමින් ජයග්‍රහණ ලැබූ ශිල්පීන් සංඛ්‍යාව - 407
- Crafting Ceylon" අපනයන අභිමුඛ හස්ත කර්මාන්ත තරඟය සහ නිෂ්පාදන ප්‍රවර්ධන වැඩසටහන - ජාතික මට්ටමින් ජයග්‍රහණ ලැබූ ශිල්පීන් සංඛ්‍යාව (Top 100) - 100

අභියෝග

- හස්ත කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය හිඟකම සහ මිල අධික වීම.
- නවීන තාක්ෂණය උපයෝගී කිරිමට ශිල්පීන් දක්වන අකැමැත්ත හා නව තාක්ෂණය භාවිතය අවම මට්ටමක පැවතීම.
- දේශීය හා විදේශීය වෙළඳපොලට ගැලපෙන නිර්මාණ ඉදිරිපත් කිරීමට ශිල්පීන් අසමත් වීම.
- නූතන පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමට ඇති අකැමැත්ත.
- හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති වීම, මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ අපහසුතා පැවතීම
- විදේශීය රටවල හස්ත කර්මාන්ත නිර්මාණයන්හි මිල සාපේක්ෂව අඩුවීම.
- සාර්ක් රටවල හස්ත කර්මාන්ත නිර්මාණ නිදහසේ ආනයනය කිරීමට හැකි වීම.
- හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර සඳහා ම සුවිශේෂී වූ ප්‍රමාණවත් මූල්‍යමය ක්‍රමවේදයක් නොමැති වීම.
- හස්ත කර්මාන්ත නිර්මාණ අපනයනය කිරීම සඳහා විදේශ වෙළඳපොල සම්බන්ධීකරණය කර ගැනීමට ඇති ගැටළු

ඉදිරි සැලසුම්

- වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 50%කින් ඉහළ නැංවීම
- වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම
- වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400 ක් නිර්මාණය කිරීම
- වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස 50% කින් ඉහළ නැංවීම

2.9.5 ජාතික මෝස්තර මධ්‍යස්ථානය

ප්‍රගතිය/ ජයග්‍රහණ

- නව නිර්මාණ සැලසුම් 349ක් සැලසුම් කිරීම
- නව නිර්මාණ සැලසුම් 270ක් නව මූලාශ්‍ර ලෙස සකස් කිරීම
- ප්‍රතිලාභින් 300 දෙනෙකුට නව නිර්මාණ හා නව තාක්ෂණික පුහුණු වැඩසටහන් 13ක් පැවැත්වීම හා නව නිර්මාණ 108ක් ක්ෂේත්‍රයට හඳුන්වාදීම
- උණ බම්බු සඳහා අත්පොතක් නිර්මාණය කර පිටපත් 500ක් මුද්‍රණය කිරීම
- නව නිර්මාණ පාදක කොට අලෙවි පර්යේෂණ වැඩසටහන් 02ක් ක්‍රියාත්මක කිරීම
- ශිල්පීන් 15 දෙනෙකු සම්බන්ධ කර ගනිමින් නව නිර්මාණ 43ක් වෙළඳපළට හඳුන්වාදීම
- නව නිර්මාණ ප්‍රචලිත කිරිම හා ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රවර්ධන වැඩසටහන් 03ක් ක්‍රියාත්මක කිරීම
- වෙළෙඳ පොළ පිළිබඳ ශිල්පීන්ගේ දැනුම ඉහළ නැංවීම සඳහා ශිල්පීන් 150කට දැනුම්වත් කිරීමේ වැඩසටහන් 03ක් පැවැත්වීම
- ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ප්‍රදර්ශණය හා කර්මාන්ත ප්‍රදර්ශනය සඳහා සහභාගි වෙමින් නව නිර්මාණ ප්‍රවර්ධනයට කටයුතු කිරීම
- බතික් කර්මාන්තයේ ගුණාත්මක බව ඉහල නැංවීමේ අරමුණ ඇතිව ප්‍රකාශනය කර ඇති විධිමත් නිෂ්පාදන ක්‍රියා පිළිවෙත් යන ප්‍රමිතිකරණය පිළිබඳ බතික් ශිල්පීන් දැනුම්වත් කිරීමේ වැඩසටහනක් ශිල්පීන් 50 දෙනෙක් හා ආයතන 08ක් සම්බන්ධ කර ගනිමින් පැවැත්වීම
- තල්කොළ මත දිලීර වර්ධනය පාලනය සඳහා සුදුසු දිලීර නාශක දියරයක් සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම
- කතරගම ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශය තුළ දෙබර ඇට ආශ්‍රිත අත්කම් කර්මාන්තය පිළිබඳ පර්යේෂණාත්මක වැඩසටහනක් සිදු කිරීම
- ගම්පහ වලව්වත්ත ප්‍රදේශයේ ජාතික ශිල්ප සභාවට අයත් පුහුණු මධ්‍යස්ථානයක් තුල ඉදිකරන ලද බතික් අපජලය පිරිපහදු කිරීමේ පද්ධතියේ ඉදිකිරීම් කටයුතු නිමකරමින් එය ක්‍රියාත්මක කරවීම

- උණ ලී වතුර බෝතල් පිරියම් කිරීමේ ක්‍රමයේ ආරක්ෂිත බව සෙවීම සඳහා කෙටිකාලීන පර්යේෂණයක් මොරටුව විශ්වවිද්‍යාලයේ රසායන හා ක්‍රියාවලි ඉංජිනේරු අංශය සමඟ ක්‍රියාත්මක කිරීම.
- අත්කම් නිෂ්පාදනයන්හි අගය වැඩි කිරීමට සිදුකල හැකි පිරියම් කිරීමේ ක්‍රම හඳුනාගැනීම සඳහා වෙනත් පෞද්ගලික පර්යේෂණායතන සමඟ සාකච්ඡා කරමින් එම ක්‍රම අත්කම් අමුද්‍රව්‍ය මත අත්හදා බැලීම
- මැටි නිෂ්පාදන සඳහා ජල පිරිපහදු රොන්මඩ නැවත භාවිතා කිරීම පිළිබඳ පර්යේෂණය යටතේ බියගම හා මහායාල ශිල්පීන්ට සේවා ලබාදීම
- අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ශාක සාර අවශේෂ භාවිතයෙන් ස්වභාවික වර්ණක නිෂ්පාදනය කිරීම ආශ්‍රිත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම
- අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ අත්යන්ත්‍ර රෙදි හා බතික් ආශ්‍රිත නව නිර්මාණ නව තාක්ෂණික හා ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන් 13 ක් ගම්පහ දිස්ත්‍රික්කය තුළ සිදුකරමින් හස්තකර්මාන්ත ශිල්පීන් 337 දෙනෙකුට සේවා ලබාදීම
- ආයතනය යටතේ පවත්නා පිරිනිර්මාණ අධ්‍යයන ආයතනය හරහා නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පවත්වමින් සිසුන්102ගේ පාඨමාලා සම්පූර්ණ කිරීම හා නව පාඨමාලා සඳහා සිසුන් 64 දෙනෙකු බඳවා ගැනීම.
- සහතිකපත් ප්‍රදානෝත්සවය හරහා ඩිප්ලෝමාධාරීන් 80 දෙනෙකුට සහතිකපත් ප්‍රදානය කරන ලදි.

අභියෝග

- සීමිත කාර්ය මණ්ඩලයක් (විශේෂයෙන් නිර්මාණකරුවන්ගේ පුරප්පාඩු පැවතීම) සමග ආයතනයේ සංවර්ධන ක්‍රියාවළිය සිදුකිරීමට සිදුවීම
- පෞද්ගලික අංශයට සාපේක්ෂව පවතින පහළ වැටුප්තල හේතුවෙන් දක්ෂ හැකියාවෙන් යුත් නිලධාරීන් (විශේෂයෙන් ඉහල නිර්මාණාත්මක හැකියාවෙන් යුත් නිර්මාණකරුවන්) බඳවා ගැනීමට නොහැකිවීම
- හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමට තරුණ පරම්පරාවේ උනන්දුව පහළ මට්ටමක පැවතීම
- සාම්ප්‍රදායික ශිල්පීය හැකියාවන් ඉක්මවා යන නව තාක්ෂණයන් වැළඳ ගැනීමට හස්තකර්මාන්ත ශිල්පීන්ගේ ඇති අකමැත්ත හා ඒ සම්බන්ධයෙන් ඇති අවම දැනුම
- චීනයෙන් සහ අනෙකුත් රටවලින් අඩු වියදම් ආනයනික ආදේශක ගෙන්වීම
- අමුද්‍රව්‍ය හිඟය, නීතිමය ගැටළු සහ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම

ඉදිරි සැලසුම්

- නව නිර්මාණ සැලසුම් 360ක් හා නව මුලාශ්‍ර 310ක් සකස් කිරීම
- ඒ ආශ්‍රිතව නව නිර්මාණ දැනුම 405 දෙනෙකුට ලබාදීම සඳහා නිෂ්පාදන සංවර්ධන වැඩසටහන් හා පුහුණු වැඩසටහන් 17ක් ක්‍රියාත්මක කිරීම
- පාසල් සිසුන්,ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන දේශීය විදේශීය පාර්ශ්වයන් සඳහා නව සංකල්ප ගොඩනැගීම, අත්කම් නිර්මාණ පිළිබඳ අත්දැකීම් ලබා දීම සඳහා ශිල්ප අත්දැකීම් වැඩසටහන් පැවැත්වීම

- නිෂ්පාදන ගුණාත්මකභාවය පිළිබඳ දැනුම ලබාදීම හා පර්යේෂණ සොයාගැනීම් ක්ෂේත්‍රයට හඳුන්වාදීම, උපදේශන සේවා හා වැඩිදියුනු කිරීම් සඳහා පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- වෙළඳපල දැනුවත්භාවය ගොඩනැගීම හරහා හස්ත කර්මාන්ත කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩසටහන් 02ක් සැලසුම් කර ඒ යටතේ බතික් නව නිර්මාණ විලාසිතා දැක්ම පැවැත්වීම
- නව නිර්මාණ ප්‍රදර්ශනයක් මහනුවර පැවැත්වීමට සැලසුම් කිරීම
- විශ්වවිද්‍යාල/ තනි පුද්ගල/ ආයතන සමග ආයතනික සහයෝගීතාවයෙන් යුත් තිරසාර නිර්මාණ ප්‍රවර්ධනය කිරිමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම
- නව නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම
- ඩිජිටල් වේදිකාව හරහා ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තරවල උරුමය නැවත ප්‍රතිපෝෂණය කිරීම සඳහා ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම
- මහනුවර නත්තරම්පොත කළාපුරය මූලික කොට අත්දැකීම් මත පදනම් වූ සංචාරක ව්‍යාපාරය ඉලක්ක කර ගනිමින් සාම්ප්‍රදායික කර්මාන්ත ගම්මාන සංවර්ධනය වැඩසටහන
- නව නිර්මාණ සංවර්ධනය හරහා තෝරාගත් හස්තකර්මාන්ත ක්ෂේත්‍රයන්හි ප්‍රවීන හස්තකර්මාන්ත ශිල්පීන් හා ව්‍යවසායකයින් සම්බන්ධීකරණ වැඩසටහනක් පැවැත්වීම
- උපදේශන සේවා සැපයීම
- පිරිනිර්මාණ අධ්‍යයන ආයතනය හරහා නිර්මාණ ක්ෂේත්‍රය සඳහා ප්‍රමිතිගත පාඨමාලා සම්පූර්ණ කල සිසුන් 100 දෙනෙකු සඳහා සහතිකපත් ප්‍රදානය කිරීම

2.9.6 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

ප්‍රගතිය/ ජයග්‍රහණ

- රජය සතු ඉඩම් වල පවතින මැණික් තැන්පතු සහ ඒවායේ පිහිටීම නවීන විද්‍යාත්මක හා නිරවද්‍ය ක්‍රමවේද හරහා හඳුනාගැනීමට නැඹුරුතාවයක් ඇති කිරීම හා මේ සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා ඒකාබද්ධව කමිටුවක් පත් කරීමට කටයුතු කිරීම.
- පළුඳු හා වටිනාකමින් අඩු මැණික් සඳහා එකතු කළ අගය වැඩි කිරීම වෙනුවෙන් විකිරණ ප්‍රතිකර්ම ඇතුළුව තාක්ෂණික ප්‍රතිකර්ම තීව්‍ර කිරීම හා මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සංවර්ධනයට නැනෝ තාක්ෂණය හඳුන්වාදීම.
- රසායානාගාර ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කිරීමට නිසි පරිදි ප්‍රතීතනයට කටයුතු කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණවල නිරවද්‍ය මිල තක්සේරුව වෙනුවෙන් පරිඝණක ආශ්‍රිත මෘදුකාංගයක් සකස් කිරීම.
- අතීතයේ මුතු ආශ්‍රිතව ශ්‍රී ලංකාව ප්‍රචලිතව පැවැති අතර මුතු වගා කිරීමේ ප්‍රවණතාවය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.
- පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට 2025 වර්ෂයේදී 1500ක පමණ වෘත්තීයවේදීන් පුහුණු කිරීමට සැලසුම් කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ ඩිප්ලෝමා 02ක් ක්‍රියාත්මක කරනු ලබන අතර ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය හා අනෙකුත් විශ්ව විද්‍යාලයන්හී සහයෝගීත්වයෙන් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සඳහා උපාධි පාඨමාලාවක් හඳුන්වාදීමට කටයුතු සිදු කරමින් පවතී.
- මහා බ්‍රිතාන්‍යයේ රත්න විද්‍යා සංගමයේ ප්‍රතීතනය හරහා එම සංගමය මඟින් මෙහෙයවන රත්නවිද්‍යා පදනම් හා ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ශ්‍රී ලංකාව තුළ ඉගැන්වීම් කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා ගැනීම හා පදනම් පාඨමාලාව ආරම්භ කිරීම.
- ශ්‍රී ලංකාවේ පතල් කර්මාන්තය හරහා ලැබෙන මැණික් බහුතරයක් කුඩා ප්‍රමාණයේ මැණික් වන අතර එම මැණික් නිරවද්‍යතාවයකින් යුතුව (±0.2mm) කැපීම මඟින් අගය එකතු කිරීම ඉහළ නැංවිය හැක. මේ වෙනුවෙන් කුඩා මැණික් කැපුම් තාක්ෂණය ඇතුළත් ඒකකයක් ස්ථාපනය කිරීම හා ඒ සඳහා පාඨමාලා ආරම්භ කිරීම.

අභියෝග

- විශේෂඥයින්ගේ හිඟය - උසස් පරීක්ෂණ ක්‍රම පිළිබඳව ප්‍රවීණතාවයෙන් යුත් ප්‍රමාණවත් පුහුණුව ලත් මැණික් විද්‍යාඥයින්, පර්යේෂකයින් සහ කාර්මිකයින් නොමැතිකම.
- කාර්ය මණ්ඩල වැටුප් - ඉහළ කුසලතා ඇති මැණික් විද්‍යාඥයින්, පර්යේෂකයින් සහ කාර්මිකයින් සේවයේ යෙදවීම සහ රඳවා ගැනීම මූල්‍යමය වශයෙන් ඉල්ලුමක් ඇති කළ හැකිය.
- පරිභෝජන ද්‍රව්‍ය සහ උපයෝගිතා - රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය, පරීක්ෂණ සඳහා මැණික් ගල් නිතිපතා මිලදී ගැනීම සහ නවීන උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ උපයෝගිතා බිල්පත්.
- පුහුණු පිරිවැය - තාක්ෂණික දියුණුව සමඟ ඉදිරියට යාම සඳහා කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව සහ කුසලතා සංවර්ධනය වියදම් වලට එකතු වේ.
- උපකරණවල ඉහළ පිරිවැය - වර්ණාවලීක්ෂ, අන්වීක්ෂ සහ ලේසර් පද්ධති වැනි උසස් මැණික් විශ්ලේෂණය සහ පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය සහ නඩත්තු කිරීම මිල අධිකය.
- පර්යේෂණ සහ සංවර්ධන සඳහා සීමිත සම්පත් - නව්‍ය පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් අරමුදල් සහ පිරිස් වෙන් කිරීමේ දුෂ්කරතාවය.
- තාක්ෂණ වැඩිදියුණු කිරීම් - මැණික් විද්‍යාත්මක පර්යේෂණවල දියුණුව සමඟ ඉදිරියට යාම සඳහා නිතිපතා වැඩිදියුණු කිරීම් මිල අධිකය.
- තාක්ෂණික අභියෝග - මැණික් සම්භවය, ප්‍රතිකාර හෝ නව තාක්ෂණයන් පිළිබඳ පර්යේෂණ කාලය ගතවන සහ සම්පත්-දැඩි විය හැකිය.
- පරිභෝජන සහ උපයෝගිතා - රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය නිතිපතා මිලදී ගැනීම, පරීක්ෂණ සඳහා මැණික් ගල් සහ නවීන උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ උපයෝගිතා බිල්පත්.
- ක්‍රමාංකනය සහ නඩත්තුව - නිතිපතා ක්‍රමාංකනය, සේවා ගිවිසුම සහ සංවේදී උපකරණ නඩත්තු කිරීම තාක්ෂණික වශයෙන් ඉතා දුෂ්කර කාර්යයකි.

ඉදිරි සැලසුම්

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළ විධිමත් අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළව උපාධි පාඨමාලාවක් සඳහා විෂයමාලා සංවර්ධනය පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම හා නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂ්ත්‍රයට අදාලව උපාධි සුදුසුකම පිරිනැම්මට හා FGA සුදුසුකම පිරිනැම්මේ පාඨමාලා ආරම්භ කිරීමට (මෙම පාඨමාලාව 2025 ජනවාරි මස ආරම්භ කරන ලදී)
- මැණික් හා ස්වර්ණාභරණ විෂයය ක්ෂ්ත්‍රයට අදාල තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම
- 2024 – 2025 අධ්‍යයන වර්ෂය සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් ක්‍රියාත්මක කිරීම
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා ජාත්‍යන්තරව පිළිගත් වෙළඳපොළක් නිර්මාණය කිරීම
- නවීන තාක්ෂණය හරහා වටිනාකමින් අඩු මැණික් සඳහා අගය එකතු කිරීම
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම
- පතල් හිමියන්ට ජාත්‍යන්තර මැණික් මිල ගණන් සහ ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු ලබා දීමේ ක්‍රියාවලියක්.

2.9.7 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

ප්‍රගතිය/ ජයග්‍රහණ

- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත සිසුන් පුහුණු කිරීම. 2024-2025 වර්ෂය සඳහා සිසුන් 64 ක් බඳවා ගෙන ඇත.
- සේවාස්ථ පුහුණු පාඨමාලා - පාඨමාලා 17 ක් සාර්ථකව අවසන් කර ඇත
- අත්යන්ත්‍ර පේෂකර්මාන්තය සඳහා උසස් පුහුණුව- පාඨමාලා 2 ක් සම්පූර්ණ කර ඇත.
- ක්ෂේත්‍රයේ පුහුණු වැඩසටහන් - පුහුණු වැඩසටහන් 06 ක් පවත්වා ඇත.
- ස්වයං රැකියා ව්‍යාපෘතිය - අත්යන්ත්‍ර ව්‍යාපෘති 06 ක් ආරම්භ කර ඇත.
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ව්‍යාපෘති නගාසිටුවීම -
- ව්‍යාපෘති 02 ක් නගා සිටුවීමට අදාල කටයුතු සිදුකර ඇත.ඉල්ලා ඇති පුහුණු ලබාදීමට කටයුතු කර ඇත.
- පාඨමාලා විෂය නිර්දේශය සකස් කිරීම මොරටු විශ්ව විද්‍යාලය වෙත යොමු කර ඇත.
- ජාතික අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ප්‍රදර්ශනය අලෙවි සල්පිළ හා සම්මාන ප්‍රදානෝත්සවය - සාර්ථකව අවසන් කර ඇත.
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත අලෙවි සල්පිළ - සාර්ථකව අවසන් කර ඇත.
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු - අදාල සාම්පල් සකස් කර ඇත. තවද පුහුණු වැඩමුළුවක් පැවැත්විය.
- විෂය මාලා සංශෝධනය හා පුහුණු ද්‍රව්‍ය සංවර්ධනය කිරීම - පේෂකර්මාන්ත අවසාන සහතිකපත්‍ර පාඨමාලාවේ විෂයන් 5 ක් සංශෝධනය කර ඇත.

අභියෝග

- අමුද්‍රව්‍ය ලබා ගැනීම පිළිබඳ ගැටළු
- රාජකාරි ඉටු කිරීමට නිලධාරීන් නොමැතිවීම.
    - සහකාර අධ්‍යක්ෂ සඳහා පුරප්පාඩු.
    - වෙනත් තනතුරු සඳහා පුරප්පාඩු.
- පර්යේෂණ හා සංවර්ධන කටයුතු සඳහා සුදුසු තාක්ෂණික කාර්ය මණ්ඩලයක් නොමැති වීම.

ඉදිරි සැලසුම්

- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ස්වයං රැකියා ව්‍යාපෘතිය
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ වෘත්තීය නිපුණතාව වර්ධනය කිරීම
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තයේ නියැලෙන සාර්ථක තරුණ ව්‍යවසායකයින්ගේ තොරතුරු ඇතුලත් විඩියෝ පටයක් නිර්මාණය කිරීම.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල - 2025 දෙසැම්බර්
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ජාතික සම්මාන ප්‍රදානෝත්සවය - 2025
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ජාතික ප්‍රදර්ශනය - 2025 දෙසැම්බර්
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයට අදාල සේවාස්ථ පුහුණු වැඩමුළු -2025
- ස්වාභාවික වර්ණ සඳහා අමුද්‍රව්‍ය වගා කිරීම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සඳහා සුදුසු තාක්ෂණය හඳුන්වාදීම.
- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත අලෙවි සල්පිල - 2025 අප්‍රේල්
- මෙරට අත් යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයට අදාළව දත්ත සහ තොරතුරු රැස් කිරීම.
- උසස් පුහුණු පාඨමාලා
- ග්‍රාමීය මට්ටමේ කර්මාන්තයේ නිරත අත්යන්ත්‍ර පේෂකර්මාන්ත ශිල්පීන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන්
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත පුහුණු ආයතනවල සිසුන් පුහුණු කිරිම
- අත්යන්ත්‍ර පේෂකර්මාන්ත මෝස්තර ග්‍රන්ථයක් සම්පාදනය කිරීම.
- ව්‍යවසායකත්ව සංවර්ධනය තුළින් අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්තයේ නියුතු කාන්තාවන් සහ තරුණ තරුණියන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම

පරිච්ඡේදය 03

වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ- ඒෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු.		සටහන	තත්‍ය 2024 රු.	තත්‍ය 2023 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		5,522,882,000	5,363,369,250	ඒසීඒ-3
-	තැන්පතු		15,577,235	43,619,962	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		44,425,198	31,383,347	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**5,582,884,433**	5,438,372,560	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**5,582,884,433**	5,438,372,560	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		115,045,632	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**5,467,838,801**	**5,438,372,560**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
1,273,373,484	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	1,169,567,136	530,976,325	
462,278,044	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	292,704,941	256,998,274	
1,446,860,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,319,382,208	1,378,901,239	ඒසීඒ-2(ii)
-	පොළී ගෙවීම්	8	-	-	
848,956	වෙනත් පුනරාවර්තන වියදම්	9	28,956	-	
3,183,360,484	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**2,781,683,241**	2,166,875,839	
	මූලධන වියදම්				
75,105,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	30,770,026	21,190,070	
16,150,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	13,123,502	2,649,870	
730,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	12	624,372,792	582,279,763	ඒසීඒ-2(ii)
3,490,000,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	3,353,910,762	2,804,527,115	
7,100,000	හැකියා වර්ධනය	14	1,839,219	780,677	
1,600,000,000	වෙනත් මූලධන වියදම්	15	742,831,509	1,341,615,282	
5,918,355,000	**මුළු මූලධන වියදම් (උ)**		**4,766,847,810**	4,753,042,777	
	තැන්පතු ගෙවීම්		14,150,900	47,457,836	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		68,192,706	37,578,724	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		82,343,605	85,036,560	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		7,630,874,656	7,004,955,175	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		(2,163,035,855)	(1,566,582,615)	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(2,164,369,172)	(1,566,582,615)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		1,333,317	-	ඒසීඒ-3
			(2,163,035,855)	(1,566,582,615)	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තත්‍ය 2024	2023
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	2,022,445,400	2,103,611,595
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	100,684,200	76,916,693
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	1,333,317	-
මුළු වත්කම්		**2,124,462,918**	**2,180,528,288**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		41,393,965	19,052,793
දේපළ පිරියත හා උපකරණ සංචිතය		2,022,445,400	2,103,611,595
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	59,290,235	57,863,900
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	1,333,317	-
මුළු වගකීම්		**2,124,462,918**	**2,180,528,288**

පිටු අංක..........සිට .... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .... සිට .... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා. ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 27/02/2025	දිනය : 27/02/2025	දිනය : 25/02/2025
ජේ.එම්. තිලකා ජයසුන්දර ලේකම් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03.	ජේ.එම්. තිලකා ජයසුන්දර ලේකම් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03.	කේ.ඒ. බන්දුල කුරුප්පු ප්‍රධාන ගණකාධිකාරි කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය 73/1, ගාලු පාර, කොළඹ 03.

ඉහත මුදල් හා මුදල් සමාන දෑ මෙන්ම, අග්‍රිම ශේෂ ලෙස දක්වා ඇත්තේ 2024 වසර මැතිවරණ රාජකාරි වෙනුවෙන් නිලධාරීන් වෙත ගෙවන ලද මැතිවරණ දීමනා රු.1,333,317ක මුදල 2024/12/31 දිනට මැතිවරණ කොමිසම මගින් නිරවුල් නොවූ අත්තිකාරම් මුදල වේ. එය 2025 පෙබරවාරි මස අදාළ පරිදි නිරවුල් කර ගැනීම කටයුතු කර ඇත.

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය 2024 රු.	2023 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	200,763,153	82,697,901
අග්‍රිම ලැබීම්	5,522,882,000	5,363,369,250
අත්තිකාරම් අයකර ගැනීම්	69,169,180	42,442,627
තැන්පතු ලැබීම්	18,007,352	43,620,026
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**5,810,821,685**	**5,532,129,804**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	1,406,439,718	784,278,469
සහනාධාර සහ මාරුකිරීම්	27,349,077	20,151,020
නෛකුත් පුනරාවර්තන වියදම්	28,956	
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,283,185	590,135,066
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	115,045,632	-
අත්තිකාරම් ගෙවීම්	68,192,731	47,614,083
තැන්පතු ගෙවීම්	16,581,067	47,457,900
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**1,635,920,366**	**1,489,636,539**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**4,174,901,319**	**4,042,493,265**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	24,852,715
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**-**	**24,852,715**

අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	4,173,568,002	4,067,345,980
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**4,173,568,002**	**4,067,345,980**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(4,173,568,002)**	**(4,042,493,265)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ) + (ඊ)	**1,333,317**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**-**	**-**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**-**	**-**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	**1,333,317**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**-**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**1,333,317**	**-**

ඒසීඒ -2

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 149

අමාත්‍යාංශයේ නම : කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

රු.

වාර්ෂික ඇස්තමේන්තුවෙ සඳහන් පරිදි වැඩසටහන් අංකය	වියදමෙහි නම	අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1)	පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2)	මු.රෙ. 66/69 මාරු කිරීම (3)	මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3)	මුළු වියදම (5)	ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5)
වැඩසටහන (1)	(1) පුනරාවර්තන	547,700,000.00	23,645,484.00	(2,400,000.00)	568,945,484.00	411,150,737.48	157,794,746.52
	(2) ප්‍රාග්ධන	71,800,000.00	-	2,050,000.00	73,850,000.00	30,322,696.71	43,527,303.29
	උප එකතුව	619,500,000.00	23,645,484.00	(350,000.00)	642,795,484.00	441,473,434.19	201,322,049.81
වැඩසටහන (2)	(1) පුනරාවර්තන	2,467,900,000.00	147,070,000.00	(555,000.00)	2,614,415,000.00	2,370,532,503.04	243,882,496.96
	(2) ප්‍රාග්ධන	5,843,600,000.00	-	905,000.00	5,844,505,000.00	4,736,525,113.19	1,107,979,886.81
	උප එකතුව	8,311,500,000.00	147,070,000.00	350,000.00	8,458,920,000.00	7,107,057,616.23	1,351,862,383.77
	මුළු එකතුව	8,931,000,000.00	170,715,484.00	-	9,101,715,484.00	7,548,531,050.42	1,553,184,433.58

....

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/

අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : ١٥ /٥١ /

කේ.ඒ. [illegible] කුරුප්පු
ප්‍රධාන ගණකාධිකාරී
කර්මාන්ත හා [illegible]යකත්ව
සංවර්ධ[illegible]ශය
73/1. [illegible] කොළඹ 03.

7

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

*යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

*තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය : අදාළ නැත

ආදයම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය රු.	අවසාන ප්‍රතිපාදනය රු.		
පුනරාවර්තන	3,015,600,000	3,183,360,484	2,781,683,241	87%
ප්‍රාග්ධන	5,915,400,000	5,918,355,000	4,766,874,810	81%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන :

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
1	149-01-02-00-2001 රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව	1. අමාත්‍යාංශයේ ප්‍රධාන ගොඩනැඟිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම	රු. 1,770,528.00	රු. 1,770,528.00	රු. 1,770,528.00	100%
2	149-01-01-0-1201 149-01-02-0-1201 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	1 අමාත්‍යාංශය සඳහා ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම 2. සහනාදායි මෝටර් රථ බලපත් නිකුත් කිරීමට අදාළ ලිපි ශීර්ෂ මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම කිරීම	රු. 67,902.63	රු. 67,902.63	රු. 62,422.00 5,480.63 67,902.63	100%
3	149-2-3-2-2506 රත්නපුර දිස්ත්‍රික්ලේකම් කාර්යාලය	නාලන්ද එල්ලාවල කර්/පුර අදියර 1 සහ 2 සඳහා ජලනල එලීම	රු. 4,407,307.86	රු. 4,407,307.86	රු. 4,407,307.86	100%
4	149-02- 03-02-2509 අම්පාර දිස්ත්‍රික්ලේකම් කාර්යාලය	නවගම්පුර කර්/පුරයේ වැට ප්‍රතිසංස්කරණය කිරීම	රු. 2,650,000.00	රු. 2,650,000.00	රු. 2,252,376.19	85%
5.	149-2- 3-2-2506 ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය 149-01-02-0-2102	1 ගාල්ල උණවටුන ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීම 2 කරන්දෙණිය කර්/පුරයේ ඉදිරිපස පිවිසුම් දොරටුව සඳහා නාම පුවරුව, ගේට්ටුව සහ මුරකුටිය ඉදි කිරීම 3.කාර්යාල උපකරණ මිල දී ගැනීම	රු. 77,815,027.33	රු. 77,815,027.33	රු. 7,218,952.99 68,605,322.51 187,620.00 76,011,895.50	97%

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
6.	149-02-03-02-2506 කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	මතුගම කර්/පුරයේ ආරක්ෂිත වැට අළුතවැඩියා කිරීම	රු. 267,548.00	රු. 267,548.00	රු. 260,048.00	97%
7.	149-02-03-01-1403 149-02-03-01-1402 බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය.	ව්‍යාපාර සේවා මධ්‍යස්ථාන ව්‍යාපෘතිය	රු. 28,270.76	රු. 28,270.76	රු. 17,670.76 10,600.00 28,270.76	100%
8.	149-02-03-03-2506 මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	උලපනේ කර්/පුරයේ අතුරු මාර්ග සංවර්ධනය කිරිම	රු. 1,326,676.65	රු. 1,326,676.65	රු. 1,324,134.18	99.8%
9.	149-01-02-0-2001 ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව	අමාත්‍යාංශයේ B ගොඩනැඟිල්ලේ වහලය අලුත්වැඩියාව	රු. 2,000,000.00	රු. 2,000,000.00	0.00	0%
10.	149-02-03-02-2506 මාතලේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	දඹුල්ල කර්/පුරයේ ප්‍රවේශ මාර්ගයෙහි මායිම් සලකුණු	රු. 130,000.00	රු. 130,000.00	රු. 130,000.00	100%
11	149-02-03-02-2506 පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	1. දංකොටුව කර්/පුරයේ පරිපාලන ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කිරීම 2 දංකොටුව කර්/පුරයේ වැසි ජලය බැසයාමේ කාණු පද්ධතිය ඉදි කිරීම	රු. 28,040,028.17	රු. 28,040,028.17	රු. 17,147,452.76	61%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	2024.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2024.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	භාණ්ඩ සමීක්ෂණ වාර්තාව නිකුත් කර නැත	74,200,000.00	නැත	-
9152	යන්ත්‍රෝපකරණ		153,908,299.16	නැත	-
9153	ඉඩම්		1,051,500,000.00	නැත	-

3.9. විගණකාධිපති වාර්තාව

ඇමුණුම 1 ලෙස ඉදිරිපත් කර ඇත (පිටු අංක i - xv).

පරිච්ඡේදය 04

කාර්ය සාධන දර්ශක

4.1. ආයතනයේ කාර්ය සාධන දර්ශක ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව

	විශේෂිත දර්ශක	දත්ත පදනම (තත්‍ය අගය 2023)	අපේක්ෂිත අගය 2024	තත්‍ය අගය 31.12.2024	පුරෝකථනය			2024 අපේක්ෂිත අගයේ ප්‍රතිශතයක් (%) ලෙස
					2025	2026	2027	
1.	වාණිජ නිෂ්පාදනයේ යෙදෙන මුළු කර්මාන්ත ගණන - සමුච්චිත	693	868	690	762	832	907	79
2.	වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන	20	60	40	79	92	107	67
3.	උත්පාදනය කරන ලද මුළු රැකියා ප්‍රමාණය - සමුච්චිත	32,525	33,425	32,691	33,531	34,431	35,531	98
4.	උත්පාදනය කරන ලද නව රැකියා ප්‍රමාණය	1,901	900	264	800	800	900	29
5.	නිෂ්පාදන කර්මාන්තයන්හි ගුණාත්මකභාවය ඉහල නැංවීමට සඳහා පහසුකම් සැපයූ කර්මාන්ත ගණන (තත්ත්ව සහතිකරණයට)	1,699	2,195	1,604	1,556	1,815	2,068	73
6.	නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත සඳහා සපයන ලද පුහුණු අවස්ථා සංඛ්‍යාව (කුසලතා/ ධාරිතා / තාක්ෂණික)	6,234	2,915	3,606	2,489	2,609	2,755	124
7.	මූල්‍ය පහසුකම් සපයන ලද කර්මාන්ත සහ ව්‍යවසායන් සංඛ්‍යාව (ණය යෝජනා ක්‍රම මඟින්) -සමුච්චිත	4,456	5,168	5,480	5,981	6,938	7,388	106
8.	නව මැණික් නිධි ගවේෂණය (ප්‍රමාණය)	3	3	3	3	4	5	100
9.	මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නව පර්යේෂණ (ප්‍රමාණය)	14	14	9	15	16	17	64

පරිච්ඡේදය 05

තිරසාර සංවර්ධන අරමුණු (SDG)

සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය / පරමාර්ථය	ඉලක්ක	කාර්ය සාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම (2024)		
			0%-49%	50%-74%	75%-100%
ඉලක්ක 9 : කර්මාන්ත නවෝත්පාදනය හා යටිතල පහසුකම් – ප්‍රත්‍යස්ථ වූ යටිතල පහසුකම් තැනීම, අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මිකකරණයක් ප්‍රවර්ධනය, නවෝත්පාදනය ධෛර්යවත් කිරීම	**9.2** අන්තර්ග්‍රහණය හා තිරසර කාර්මික කරණයක් ප්‍රවර්ධනය කිරීම හා කර්මාන්ත අංශය රැකියා ප්‍රමාණයට හා දළ ජාතික නිෂ්පාදනය දක්වන දායකත්වය 2030 වන විට අවම වශයෙන් 50% කින් වැඩි කිරීම.	**9.2.1** නිෂ්පාදන එකතු කළ වටිනාකම දළ දේශීය නිෂ්පාදිතයේ සහ ඒක පුද්ගල නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස			
		• වාණිජ නිෂ්පාදනයේ යෙදෙන නව කර්මාන්ත ගණන		67	
		• තත්ත්ව වැඩිදියුණු කිරීම / තත්ත්ව සහතික කිරීම සඳහා සහාය වන නිෂ්පාදන කර්මාන්ත ගණන		73	
		• මැණික් හා ස්වර්ණාභරණ අපනයන වටිනාකම කාර්මික නිෂ්පාදන අපනයනයෙන් 4% ක ප්‍රතිශතයක් ලෙස පවත්වාගෙන යාම			106
		9.2.2 රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව නිෂ්පාදන රැකියා මුළු රැකියා ප්‍රමාණයේ අනුපාතයක් ලෙස			
		• රැකියාව, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ජනනය කරන ලද නව රැකියා අවස්ථා ගණන	29		

ඉලක්කය / පරමාර්ථය	ඉලක්ක	කාර්ය සාධන දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම (2024)		
			0%-49%	50%-74%	75%-100%
	9.3 විශේෂයෙන් දියුණු වන රටවල කුඩා පරිමාණයේ කර්මාන්ත හා ව්‍යාපාරවලට ලැබෙන මූල්‍ය පහසුකම් හා වෙළෙඳපොළ සඳහා ඇති ප්‍රවේශය සහ අවස්ථාවන් ඉහළ නැංවීමත් එම ව්‍යවසායන් වටිනාකම් දාමයන්ට සහ වෙළඳපොළ දාමයන්ට ඒකාබද්ධ කිරීම	**9.3.2** ණය හෝ ණය රේඛාව සහිත ප්‍රවර්ධනය කරන ලද කුඩා පරිමාණ කර්මාන්තවල අනුපාතය			
		• ණය යෝජනා ක්‍රම මගින් මූල්‍යමය ආධාර ලබන කර්මාන්ත / ව්‍යවසායන් ගණන			106
	9.5 විද්‍යාත්මක පර්යේෂණ වැඩිදියුණු කිරීම	**9.5.1** පර්යේෂණ හා සංවර්ධන වියදම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස			
		• මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නව පර්යේෂණ		64	

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ තොරතුරු ප්‍රතිශතයක් ලෙස පරිච්ඡේද 5,1 හි ඉලක්ක **9.2, 9.3** සහ **9.5** තුළ දක්වා ඇත.

පරිච්ඡේදය 06

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/(අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	68	47	21
තෘතීයික	6	4	2
ද්විතීයික	955	771	184
ප්‍රාථමික	126	100	26

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත දන්වා ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

දේශීය පුහුණු වැඩසටහන් - 2024

	වැඩසටහනේ නම	පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව	කාල සීමාව	ආයෝජන මුදල (රු.)	පුහුණුව දේශීය/ විදේශීය	නිමැවුම/ ලබා ගත් දැනුම
1	කාර්යාල කාර්ය සහයකයින් සඳහා පුහුණු වැඩසටහන	60	දින 01	12,750	දේශීය	කාර්යාල කාර්ය සහයකයින්ගේ වගකීම, කාර්යක්ෂමතාව හා විනය සම්බන්ධයෙන් දැනුම ලබා දීම
2	රජයේ වත්කම් කළමනාකරණය සහ හානි හා පාඩු සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන	70	දින 01	12,000	දේශීය	රජයේ සම්පත් කලමනාකරණය කිරීම විධිමත් කිරීම සහ මුදල් රෙගුලාසි විධි විධානයන්ට යටත්ව අලාභහානි සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය පිළිබඳ දැනුම ලබා දීම
3	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන - සංවර්ධන නිලධාරීන් හා කලමනාකරණ සේවා නිලධාරීන් සඳහා	63	දින 03	394,441	දේශීය	කාර්යක්ෂම හා ඵලදායී රාජ්‍ය සේවයක් සඳහා ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි, සුපිළිපන්නභාවය, කණ්ඩායම්කරණය, නායකත්ව සංකල්ප හා පෞරුෂත්වය හා නායකත්වය ආශ්‍රිත බැහැරගත ක්‍රියාකාරකම්
4	රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම සඳහා වූ දෙමළ භාෂා පුහුණු වැඩසටහන	97	දින 17	76,500	දේශීය	සේවා අවශ්‍යතාවය මත දෙවන භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කිරීම
5	රජයේ වැටුප් ලේඛන පද්ධතිය පිළිබඳ පුහුණු වැඩසටහන	1	දින 01	18,000	දේශීය	රජයේ නිලධාරීන්ගේ වැටුප් සකස් කිරීම හා සම්බන්ධ සීඝ්‍රස් පද්ධතිය පිළිබඳ මනා පුහුණුවක් ලබා ගැනීම
6	පශ්චාත් උපාධි	1	අවු 01	661,732.68	දේශීය	සේවා අවශ්‍යතා සපුරා ගැනීම.
7	පශ්චාත් උපාධි	1	අවු 01	200,000	දේශීය	සේවා අවශ්‍යතා සපුරා ගැනීම.

සෘජු විදේශ පුහුණු හා සංචාර - 2024

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
1	ශ්‍රී ලංකාව සහ ඉන්දියාව අතර ආර්ථික හා තාක්ෂණ සහයෝගිතා ගිවිසුම පිළිබඳ 13 වන සාකච්ඡා වටය	1	07.01 .2024	11.01 .2024	676,579.20	විදේශීය	අමාත්‍යාංශය නියෝජනය කරමින් භාණ්ඩ වෙළඳාම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සාමාජිකයෙකු ලෙස
2	පාසල් ව්‍යවසායකත්ව නව ගුරුවරුන් සඳහා ඉන්දියාවේ කර්මාන්ත ශාලා චාරිකාව	2	22.01 .2024	24.01 .2024	1,172,430. 80	විදේශීය	පාසල් මෙහෙයවීම තුළින් කර්මාන්ත හා නවෝත්පාදන නිර්මාණය කිරීමට අවශ්‍ය ව්‍යවසායක සංස්කෘතියක් සහ මානසිකත්වයක් ගොඩනැගීම.
3	37 වන සුරාජ්කුන්ඩ් ජාත්‍යන්තර ශිල්ප මේලා	2	01.02 .2024	20.02 .2024	678,588.89	විදේශීය	ශ්‍රී ලාංකික ශිල්පීන්ගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා දේශීය අත්කම් ජාත්‍යන්තරව ප්‍රවර්ධනය කිරීම. තවද මෙම අත්කම් ප්‍රදර්ශනය සඳහා සහභාගී වන අතරතුර ශිල්පීන් සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය සහාය ලබා දීම.
4	විදුලි බලාගාර තක්සේරු කිරීමේ පුහුණු අවස්ථාව	2	03.02 .2024	20.02 .2024	-	විදේශීය	බලාගාර තක්සේරුව පිළිබඳ දැනුම ලබා ගැනීම
5	ඇගයීම් නායකයා සඳහා විධායක පාඨමාලාව	1	24.02 .2024	10.03 .2024	116,448.75	විදේශීය	ඇගයීම පිළිබඳ දැනුම ලබා ගැනීම
6	භාරත් ටෙක්ස් 2024	1	24.02 .2024	01.03 .2024	-	විදේශීය	රෙදිපිළි කර්මාන්තය පිළිබඳ දැනුම ලබා ගැනීම
7	උසස් මැණික් පරීක්ෂණ උපකරණ සඳහා විදේශ පුහුණුව	2	02.04 .2024	05.04 .2024	60,083.00	විදේශීය	එහි ක්‍රියාකාරිත්වය සහ පරීක්ෂණ ක්‍රම වැඩිදියුණු කිරීම සඳහා ප්‍රයෝජනවත් වන මෙට්‍රොම් රාමන් උපකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම
8	ලංකා ලේලන්ඩ් සමාගම සහ ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම අතර ගිවිසුම් අත්සන් කිරීම	1	17.03 .2024	20.03 .2024	-	විදේශීය	මෙහෙයුම් පැවැත්විය යුතු ආකාරය සහ ලංකා ලේලන්ඩ් සමාගම සහ ලංකා අශෝක් ලේලන්ඩ් සමාගම අතර පැන නගින නෛතික බැඳීම සහතික කිරීම සඳහා ඒකාබද්ධ ව්‍යාපාර ගිවිසුම
9	තිරසාර සෞඛ්‍ය සම්පන්න ආහාර සඳහා පලතුරු සහ එළවළු (නැවුම්) මැද අවුරුදු රැස්වීම	1	24.03 .2024	28.03 .2024	113,923.13	විදේශීය	ශ්‍රී ලංකාවේ පලතුරු සහ එළවළු වල පසු අස්වනු කළමනාකරණය සහ ආහාර සුරක්ෂිතතාව (ක්ෂුද්‍රජීව විද්‍යාත්මක හා පළිබෝධනාශක අපද්‍රව්‍ය ඇතුළුව) පරතරය තක්සේරු කිරීම පිළිබඳ අධ්‍යයනය

	වැඩසටහන	සහභාගී වූ නිලධාරීන් සංඛ්‍යාව	කාල පරාසය		ආයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
10	ගෝලීය සර්කෝන් සමුළුව	2	15.04 .2024	20.04 .2024	1,738,459. 76	විදේශීය	සර්කෝනියම් සිලිකේට් කර්මාන්තය සහ වෙළඳපොළ පිළිබඳ දැනුම ලබා ගැනීම
11	කාර්මික සහජීවනය පිළිබඳ බහුරට නිරීක්ෂණ අධ්‍යයන මෙහෙවර	2	20.05 .2024	24.05 .2024	75,205.63	විදේශීය	තිරසාර කාර්මික සංවර්ධනය සහ පරිසර හිතකාමී පොකුරු සඳහා උපාය මාර්ග සහ අනුපූරක පියවර හඳුනාගෙන ඇත
12	ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා මැණික් නිෂ්පාදන වල අගය එකතු කිරීම පිළිබඳ වැඩමුළුව	2	20.04 .2024	27.04 .2024	101,684.57	විදේශීය	මැණික් නිෂ්පාදන, අපද්‍රව්‍ය අඩු කිරීම, නිෂ්පාදන ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල වීම සඳහා ශිල්පීය ක්‍රම සහ තාක්ෂණයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
13	වෙළඳ ප්‍රවර්ධන පුද්ගලික සමාගමේ උත්පාදක යන්ත්‍රය මත කම්පන අධීක්ෂණය කිරීමට	2	27.03 .2024	30.03 .2024	96,768.00	විදේශීය	කම්පනය පරිපාලනය කිරීම සහ අධීක්ෂණය කිරීම
14	ඒකාබද්ධ NAM S& T මධ්‍යස්ථානය - උසස් අධ්‍යාපන හා පර්යේෂණ JSS ඇකඩමිය, මයිසූර්, ඉන්දියානු ශිෂ්‍යත්වය	1	09.04 .2024	22.05 .2024	112,076.25	විදේශීය	නැනෝ තාක්ෂණයට අදාළ තාක්ෂණයන්, උපකරණ සහ විශේෂඥතාව පිළිබඳ දැනුම ලබා ගැනීම
15	බලපෑම් අස්වනු සංසදය 2024 - ඇතුළත් ව්‍යාපාර සඳහා ආයෝජනය කිරීම	2	22.05 .2024	25.05 .2024	29,954.00	විදේශීය	කෘෂිකර්මාන්තය සහ ආහාර පද්ධතිවල ඇතුළත් ව්‍යාපාර ආකෘති ප්‍රවර්ධනය කිරීම සඳහා තීරණාත්මක මාර්ග පිළිබඳ මාස්ටර් පන්ති සහ සහයෝගී සම-නිර්මාණ වැඩමුළු හරහා අවබෝධයක් ලබා ගැනීම.
16	ආහාර සුරක්ෂිතතාව සහ පාලනය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	1	26.05 .2024	02.06 .2024	44,987.25	විදේශීය	ආහාර සුරක්ෂිතතාව ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති, උපදේශන සේවා සහ ප්‍රතිපත්ති සංවර්ධන ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම ලබා ගැනීම
17	ස්මාර්ට් නිෂ්පාදන විශේෂඥයින් පිළිබඳ පුහුණු පාඨමාලාව	1	25.08 .2024	31.08 .2024	115,343.79	විදේශීය	කර්මාන්තයේ SM තාක්ෂණයන් සහ ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග පිළිබඳ දැනුම ලබා ගැනීම, ස්මාර්ට් කර්මාන්තශාලා නිර්මාණය පිළිබඳ දැනුම ලබා ගැනීම
18	කාර්මික උද්‍යාන නායකත්ව පුහුණු වැඩසටහන	1	22.06 .2024	30.06 .2024	61,010.00	විදේශීය	විදේශ ආයෝජන පසුබිම් වර්ග, සංවර්ධන ඓතිහාසික, අදාළ නීති සහ රෙගුලාසි සහ FIE වල සංවර්ධන ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම

	වැඩසටහන	සහභාගි වූ නිලධාරින් සංඛ්‍යාව	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
19	8 වන චීනය දකුණු ආසියානු ප්‍රදර්ශනය සහ 28 වන චීනය Kunming ආනයන හා අපනයන වෙළඳපොළ	2	20.07 .2024	30.07 .2024	3,227,438. 00	විදේශීය	ශ්‍රී ලාංකික සහභාගිවන්නන්ට පරීක්ෂණ සහ තක්සේරුකරණය අනුව ඔවුන්ගේ ඇණවුම් ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා මැණික් පරීක්ෂණාගාරයක් සංවිධානය කරන ලදී.
20	"තනි අවශේෂ ක්‍රමය විශ්ලේෂණය" පිළිබඳ පසු විපරම් පුහුණුව	1	21.07 .2024	24.07 .2024	-	විදේශීය	ශ්‍රී ලාංකික සහභාගිවන්නන්ට පරීක්ෂණ සහ තක්සේරුකරණය අනුව ඔවුන්ගේ ඇණවුම් ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා මැණික් පරීක්ෂණාගාරයක් සංවිධානය කරන ලදී.
21	ගුණාත්මක ස්කන්ධ වර්ණාවලීක්ෂය පිළිබඳ පාඨමාලාව (CW-QMS)	1	14.09 .2024	29.09 .2024	105,502.25	විදේශීය	නවතම සාම්පල සකස් කිරීම සහ උපකරණ ශිල්පීය ක්‍රම, අපද්‍රව්‍ය මට්ටමින් රසායනික දූෂක හඳුනා ගැනීම සහ විශ්ලේෂණය පිළිබඳ දැනුමක් ලබා ගැනීම.
22	ශ්‍රී ලාංකික සහ මියන්මාර ව්‍යවසායකයින් අතර වැඩමුළුව සහ වෙළඳපොළ සම්බන්ධතා ඇති කිරීම සඳහා කර්මාන්තශාලා සංචාරය	2	23.08 .2024	27.08 .2024	120,110.00	විදේශීය	දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ගෝලීය වෙළඳපොළ සන්දර්භයට නිරාවරණය වීම තුළින් ජාත්‍යන්තර වෙළඳපොළ සම්බන්ධතා සහ වෙළඳ අවස්ථා ස්ථාපිත කර වෙළඳපල සන්දර්භයේ ප්‍රතිලාභ දැක බලා ගැනීමට සහ උපයෝගී කර ගැනීමට හැකි විය.
23	ඉන්දියානු ජාත්‍යන්තර පාවහන් ප්‍රදර්ශනය 2024 සඳහා ආරාධනය සහ ප්‍රභූ ආගන්තුක සත්කාරය	2	08.08 .2024	11.08 .2024	325,205.25	විදේශීය	නවතම නවෝත්පාදනයන් සහ මෝස්තර සහ විලාසයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
24	ඉන්දියාවේ අශෝක් ලේලන්ඩ් මෝටර් රථ නිෂ්පාදනාගාරයට සංචාරය	6	19.08 .2024	23.08 .2024	179,457.00	විදේශීය	නවීන ස්වයංක්‍රීය නිෂ්පාදන ශිල්පීය ක්‍රම පිළිබඳ සෘජු අවබෝධය වැඩි දියුණු කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
25	දකුණු සම්බන්ධීකරණ කවුන්සිලයේ තිරසාර සංවර්ධනය සඳහා විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ 25 වන රැස්වීම (COSMATS)	1	08.09 .2024	13.09 .2024	37,326.88	විදේශීය	අනෙකුත් සාමාජික රටවල් සහ COMSATS ලේකම් කාර්යාලය සමඟ සහයෝගීතාවයේ ප්‍රගතිය සාකච්ඡා කිරීමට සහ රැස්වීම අවස්ථාව ලබා දුන්නේය.

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
26	ආසියාවේ SCP ප්‍රවේශය යටතේ තිරසාර රාජ්‍ය ප්‍රසම්පාදනය (SPP) තුළ ජීවන චක්‍ර පිරිවැය (LCC) පිළිබඳ පුහුණුව - ඉදිරි ව්‍යාපෘති 5	1	23.09 .2024	26.09 .2024	30,437.50	විදේශීය	ටෙන්ඩර් ඇගයීමේ ක්‍රියාවලිය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින්, රටවල අදාළ SPP යෝජනා ක්‍රමවල නෛතික පසුබිම ඉදිරියේ LCC සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා ඉලක්කගත රටවල රජයේ නිලධාරීන්ගේ දැනුම, තාක්ෂණික කුසලතා සහ ප්‍රායෝගික නිපුණතා හා සම්බන්ධ ධාරිතාව.
27	තාක්ෂණ හුවමාරුවේ ධාරිතා වර්ධනය සඳහා වූ කලාපීය වැඩමුළුව සහ සෞඛ්‍ය තාක්ෂණයට ප්‍රවේශය වැඩි කිරීම සඳහා මහජන සෞඛ්‍ය නැඹුරු බුද්ධිමය දේපළ බලපත්‍ර ගිවිසුම්	1	18.11 .2024	22.11 .2024	29,204.50	විදේශීය	දේශීය නිෂ්පාදනය සහ වෛද්‍ය නිෂ්පාදන සඳහා ප්‍රවේශය වේගවත් කිරීම සඳහා තාක්ෂණික හුවමාරුව සඳහා ධාරිතා වර්ධනය සහ විකල්ප ගවේෂණය කිරීම.
28	චීනය ජාත්‍යන්තර ආනයන එක්ස්පෝ (CIIE) 7 වන සංස්කරණය	2	03.11 .2024	11.11 .2024	2,153,359. 80	විදේශීය	ශ්‍රී ලංකා මැණික් ප්‍රවර්ධනය කිරීම, ජාත්‍යන්තර ගැනුම්කරුවන් හමුවීම, SL මැණික් අලෙවිය වැඩි කිරීමට උපකාර කිරීම
29	ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්හි (MSME) ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා ජාතික හැකියාවන් ශක්තිමත් කිරීම සහ සංවර්ධනය වෙමින් පවතින රටවල 2030 න්‍යාය පත්‍රය සහ SDG ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම සඳහා ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව	2	10.11 .2024	14.11 .2024	58,489.00	විදේශීය	MSME ව්‍යාපාර වාතාවරණය, තරඟකාරිත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා හිඩැස්, අභියෝග, අවස්ථා, හොඳ භාවිතයන් හඳුනා ගැනීම සහ නව්‍ය හවුල්කාරිත්වයන් සඳහා පහසුකම් සැලසීම; තිරසාර සංවර්ධනය වේගවත් කිරීම සහ 2030 න්‍යාය පත්‍රය ශක්තිමත් කිරීම සඳහා MSME දායකත්වය පුළුල් කිරීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ අන්තර් රාජ්‍ය ක්‍රියාවලීන් සහ රැස්වීම් දැනුවත් කිරීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම
30	ස්ටොක්හෝම් සම්මුතිය යටතේ ගෝලීය අධීක්ෂණ සැලැස්ම සඳහා කලාපීය සංවිධාන කණ්ඩායම් සහ ගෝලීය සම්බන්ධීකරණ කණ්ඩායමේ රැස්වීම	1	10.11 .2024	17.11 .2024	43,866.75	විදේශීය	ගෝලීය අධීක්ෂණ සැලැස්මේ (GMP-4) සිව්වන අදියර ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කර කෙටුම්පත් අවසන් කරන ලදී GMP සඳහා යාවත්කාලීන කරන ලද මාර්ගෝපදේශ

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
31	ක්ෂුද්‍රජීවී වර්ගීකරණය සහ ජාන විද්‍යාව පිළිබඳ වැඩමුළුව: දැනුම පරතරය පියවීම	1	17.11 .2024	24.11 .2024	-	විදේශීය	දැඩි විද්‍යාත්මක පර්යේෂණ සහ නව්‍ය විසඳුම් හරහා තිරසාර කෘෂිකාර්මික භාවිතයන් ප්‍රවර්ධනය කිරීම සහ ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම.
32	41 වන තායිලන්ත ජාත්‍යන්තර මෝටර් රථ ප්‍රදර්ශනය 2024 ට සමගාමීව නිරාවරණය/අධ්‍යයන චාරිකාව	1	30.11 .2024	06.12 .2024	563,418.80	විදේශීය	ජාත්‍යන්තර වෙළඳපල අවශ්‍යතා, බුද්ධිය සහ තාක්ෂණික වර්ධනයන් පිළිබඳ දැනුම ලබා ගැනීම
33	හරිත සංක්‍රාන්තිය සඳහා මූල්‍යකරණය සහ ක්‍රියාත්මක කිරීම: ජාතික සහ කලාපීය ප්‍රතිපත්ති අත්‍යවශ්‍ය කරුණු	2	15.12 .2024	17.12 .2024	43,503.00	විදේශීය	පෞද්ගලික මූල්‍යකරණය වේගවත් කිරීමේදී ප්‍රතිපත්ති සම්පාදකයින්ගේ සහ නියාමකයින්ගේ අවශ්‍ය ක්‍රියාමාර්ග ඇතුළුව සංවර්ධනය සඳහා මූල්‍යකරණය වැඩි කිරීම සඳහා මූල්‍ය රාමු සහ කාර්මික සහ වෙළඳ ප්‍රතිපත්ති.
34	ගෝලීය රෙදිපිළි සහ ඇඟුම් පැළඳුම් වැඩසටහන පිළිබඳ සම්මන්ත්‍රණය	1	23.11 .2024	30.11 .2024	142,367.21	විදේශීය	තිරසාර රෙදිපිළි ක්ෂේත්‍රයේ ප්‍රමුඛ නවෝත්පාදන පිළිබඳ දැනුම ලබා ගැනීම

විදේශ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් විදේශ ශිෂ්‍යත්ව සහ සංචාර - 2024

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන්	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
1	ITEC: රාජ්‍ය ව්‍යවසායන් විගණනය කිරීම	1	07.01 .2024	03.02 .2024	147,193 .88	විදේශීය	විගණන පද්ධති, ක්‍රම සහ ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීම
2	ආයෝජන ප්‍රවර්ධන ප්‍රතිපත්තිය සහ මෙකොං සහ දකුණු ආසියානු රටවල් සඳහා කාර්මික තරගකාරිත්වය ඉහළ නැංවීම පිළිබඳ වැඩමුළුව	1	05.02 .2024	15.02 .2024	78,236. 25	විදේශීය - මාර්ගගත	ආයෝජන ප්‍රවර්ධන ප්‍රතිපත්තිය, සුදුසුකම් ලත් ක්‍රියාකාරකම්, නිර්ණායක සහ කොන්දේසි / දිරිගැන්වීම්, ආයෝජන ප්‍රවර්ධන සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය, විදේශ විදේශිකයන් ගෙන්වා ගැනීමේ ක්‍රියා පටිපාටි, විදේශ ආයෝජකයින් සඳහා නීතිමය ගැටළු, පූර්ව සහ පසු ආයෝජන ගැටළු විසඳීම, ආයෝජන ප්‍රවර්ධනය සහ පහසුකම් සැපයීම සඳහා පෞද්ගලික අංශවල කාර්යභාරය පිළිබඳ දැනුම ලබා ගැනීම
3	KOICA ශාස්ත්‍රපති ශිෂ්‍යත්ව වැඩසටහන 2024	1	25.08 .2024	31.12 .2025	137,938 .42	විදේශීය	ශාස්ත්‍රපති උපාධි වැඩසටහන
4	සංවර්ධනය වෙමින් පවතින රටවල යන්ත්‍රෝපකරණ කර්මාන්ත කළමනාකරණ නිලධාරීන් සහ කර්මාන්ත නායකයින් සඳහා සම්මන්ත්‍රණය	3	27.03 .2024	12.04 .2024	413,934 .99	විදේශීය	යන්ත්‍රෝපකරණ කර්මාන්තයේ, පරිවර්තනය සහ වැඩිදියුණු කිරීමේ මාර්ගය, විද්‍යාත්මක හා තාක්ෂණික උපාය මාර්ග සහ තාක්ෂණික නවෝත්පාදනය ජනප්‍රිය කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
5	BRI රටවල චින්තන පර්ෂද සඳහා ධාරිතා වර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	1	07.04 .2024	23.04 .2024	136,671 .15	විදේශීය	ජාතික තත්ත්වයන් සහ සංවර්ධනය, දරිද්‍රතාවය පිටුදැකීම, කාර්මිකකරණය සහ SEZ සහ BRI සහ උසස් තත්ත්වයේ සම්බන්ධතාවය පිළිබඳ දැනුම ලබා ගැනීම

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන්	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
6	වාර්ෂික ජාත්‍යන්තර පුහුණු පාඨමාලාව: "විදුලි හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කර්මාන්තය සඳහා නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය පිළිබඳ පාරිසරික තිරසාරභාවය වැඩි දියුණු කිරීම සඳහා පුහුණුව"	1	14.07.2024	20.07.2024	45,415.50	විදේශීය	පරිසරය සහ තායිලන්ත කාර්මික සංවර්ධනය පිළිබඳ ගෝලීය ප්‍රතිපත්තිය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය - නැවත භාවිතා කිරීම සහ ප්‍රතිචක්‍රීකරණය, ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය සහ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශය පිළිබඳ දැනුම
7	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කාර්මික උද්‍යාන ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	4	15.04.2024	01.05.2024	543,477.88	විදේශීය	විදේශ ආයෝජන පසුබිම් වර්ග, සංවර්ධන ඓතිහාසික, අදාළ නීති සහ රෙගුලාසි සහ FIE වල සංවර්ධන ලක්ෂණ පිළිබඳ දැනුම ලබා ගැනීම
8	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා කුඩා වෙළඳ භාණ්ඩ වෙළඳපොළ ඉදිකිරීම සහ දරිද්‍රතාවය තුරන් කිරීම සහ තුරන් කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	1	09.05.2024	25.05.2024	136,425.53	විදේශීය	කුඩා වෙළඳ භාණ්ඩ වෙළඳපොළ ඉදිකිරීමේ මූලික සංකල්ප, වෙළඳපොළ ස්ථානගත කිරීම සහ සංවර්ධන මාවත පිළිබඳ පර්යේෂණ
9	විවෘත වේදිකා (නිදහස් වෙළඳ කලාප, සංවර්ධන කලාප, විශේෂ රේගු අධීක්ෂණ කලාප, අධි තාක්ෂණික සංවර්ධන කලාප, ජාත්‍යන්තර කර්මාන්ත) ඉදිකිරීම සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	2	19.05.2024	04.06.2024	274,360.20	විදේශීය	නිදහස් වෙළඳ කලාප සහ ආර්ථික සංවර්ධනය, නිදහස් වෙළඳ ගිවිසුමේ අත්‍යවශ්‍ය කරුණු, ජාත්‍යන්තර වෙළඳ නීති සහ රෙගුලාසි වල බලපෑම, නිදහස් වෙළඳ කලාපවල මූල්‍ය හා බදුකරණ පද්ධති නවෝත්පාදනය, වෙළඳ පහසුකම් සැපයීම සහ ආයතනික නවෝත්පාදනය, තීරයක් සහ මාවතක් මුලපිරීමේ අර්ථ නිරූපණය පිළිබඳ දැනුම
10	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා උසස් තාක්ෂණික කර්මාන්ත හා නවෝත්පාදන සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය	2	22.05.2024	07.06.2024	273,242.26	විදේශීය	අධි තාක්‍ෂණික කර්මාන්ත සංවර්ධනය, කළමනාකරණ පද්ධති ප්‍රතිසංස්කරණය සහ චීනයේ උපාය මාර්ග සහ සැලසුම්කරණය, විද්‍යා හා තාක්ෂණ නවෝත්පාදන සහ ඉන්කියුබේටර් පිළිබඳ පර්යේෂණ, ගෝලීයකරණ යුගයේ ජාත්‍යන්තර විද්‍යාත්මක හා තාක්ෂණික සහයෝගීතාව, උපායමාර්ගික නැගී එන කර්මාන්ත සංවර්ධනය පිළිබඳ දැනුම

	වැඩසටහන	සහභාගි වූ නිල ධාරීන්	කාල පරාසය		ආයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
11	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ජාත්‍යාන්තර නිෂ්පාදන ධාරිතාව සහ උපකරණ නිෂ්පාදන සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය	7	09.06 .2024	26.06 .2024	942,463 .34	විදේශීය	ජාත්‍යාන්තර නිෂ්පාදන ධාරිතාව සඳහා ධාරිතාව, සහයෝගීතාවය, ජාතික ප්‍රතිපත්ති සහ සංවර්ධන උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම, ගෝලීය සංවර්ධනයට මුලපිරීම යටතේ චීනය සහ සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ප්‍රායෝගික සහයෝගීතාව පිළිබඳ දැනුම
12	BRI හවුල්කාර රටවල් සඳහා කර්මාන්ත හා ආයෝජන සහයෝගීතාව පිළිබඳ සම්මන්ත්‍රණය	3	17.06 .2024	03.07 .2024	414,925 .20	විදේශීය	කර්මාන්ත හා වෙළඳාම ආයෝජන ක්ෂේත්‍රයේ සන්නිවේදනය සහ සහයෝගීතාව සඳහා නව්‍ය, විවෘත, සාධාරණ, ඇතුළත් සහ ජයග්‍රාහී වේදිකාවක් ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳ දැනුම
13	ගෝලීය සංවර්ධන වැඩපිළිවෙළ යටතේ වෙළඳ, ආයෝජන සහ කාර්මික සහයෝගිතා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	1	24.06 .2024	10.07 .2024	138,888 .90	විදේශීය	සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් වෙළඳ, ආයෝජන සහ ව්‍යාපාරික සහයෝගීතාව භාවිතා කරන ආකාරය පිළිබඳ පුළුල් දැනුමක් ලබා ගැනීම
14	ගෝලීය සංවර්ධන මුලපිරීම යටතේ වාණිජ හා කර්මාන්ත මණ්ඩල සඳහා ඩිජිටල් ආර්ථිකය සහ කාර්මික වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	1	11.06 .2024	27.06 .2024	137,882 .10	විදේශීය	කර්මාන්ත ක්ෂේත්‍රයේ නිර්මාණාත්මක කර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ඩිජිටල් තාක්ෂණය බහු-පාර්ශ්විකව භාවිතා කරන ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
15	BRI හවුල්කාර රටවල් සඳහා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සඳහා ව්‍යාපාර පරිසරය ප්‍රශක්තිකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	4	08.07 .2024	24.07 .2024	554,591 .68	විදේශීය	ව්‍යාපාරික පරිසරය, සංවර්ධන තත්ත්වය සහ ව්‍යාපාරික පරිසරයේ ප්‍රවණතාවය ප්‍රශස්ත කිරීම සඳහා ප්‍රතිපත්ති සහ මුලපිරීම්; විදේශ ආයෝජන භාවිතය කෙරෙහි අවධානය යොමු කිරීම, සංවර්ධන තත්ත්වය, නව කර්මාන්ත සහ නව ක්‍රම හඳුන්වා දීම පිළිබඳ දැනුම
16	ආසියානු සංවර්ධන බැංකුව: විශේෂඥ - වෘත්තික වැඩමුළුව සහ ඉන්දුනීසියානු ප්‍රදර්ශනය තාක්ෂණික ආරම්භක පරිසර පද්ධති සංවර්ධනය	1	08.09 .2024	15.09 .2024	59,723. 00	විදේශීය	සංවර්ධනය වෙමින් පවතින රටවල තිරසාර සංවර්ධනය සඳහා පරිසර පද්ධතිය වඩාත් හොඳින් භාවිතා කරන ආකාරය පිළිබඳ දැනුම ලබා ගැනීම.

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන්	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
17	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා පාවහන් කර්මාන්ත සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය	5	10.09 .2024	26.09 .2024	684,802 .90	විදේශීය	දියුණු සපත්තු තාක්ෂණය සහ බුද්ධිමත් සංවර්ධන ප්‍රවණතාවය; ඔවුන්ගේ රටේ සපත්තු කර්මාන්තයේ සංවර්ධනය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම සහ ඒ සමඟම චීනයේ සපත්තු කර්මාන්තය සමඟ හුවමාරු සහ සහයෝගීතාව ශක්තිමත් කිරීමට උපකාරී වීම.
18	BRI හවුල්කාර රටවල් සඳහා නව යටිතල පහසුකම් ඉදිකිරීම සහ කාර්මික පරිවර්තනය සහ වැඩිදියුණු කිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	2	10.09 .2024	26.09 .2024	273,921 .16	විදේශීය	ප්‍රතිසංස්කරණ සහ විවෘත කිරීම් සහ ආර්ථික සංවර්ධනය, නාගරික ප්‍රවාහන යටිතල පහසුකම් සංවර්ධනය, දුම්රිය තොරතුරුකරණ ඉදිකිරීම්, ස්මාර්ට් නගර සහ ස්මාර්ට් ප්‍රවාහනය, කාර්මික සංවර්ධන ප්‍රතිපත්ති සහ භාවිතයන්, කාර්මික වැඩිදියුණු කිරීම සහ බහුපාර්ශ්වික සහයෝගීතාව සහ දේශසීමා ඊ-වාණිජ්‍ය සැපයුම් සඳහා යටිතල පහසුකම් ඉදිකිරීම.
19	ශ්‍රී ලංකාව සඳහා නිදහස් වෙළඳ කලාපය (වරාය) ඉදිකිරීම පිළිබඳ සම්මන්ත්‍රණය	5	05.09 .2024	20.09 .2024	684,426 .00	විදේශීය	නිදහස් වෙළඳ කලාප උපාය මාර්ගය, හයිනාන් නිදහස් වෙළඳ වරාය සංවර්ධනය, ක්‍රියාත්මක කර ඇති ආයෝජන ප්‍රවර්ධනය සහ ව්‍යාපාර පරිසරය ප්‍රශස්තකරණ උපාය මාර්ග ඇතුළුව.
20	BRI හවුල්කාර රටවල් සඳහා නැගී එන කර්මාන්ත පිළිබඳ සම්මන්ත්‍රණය	4	07.10 .2024	23.10 .2024	538,095 .00	විදේශීය	නැගී එන කර්මාන්තවල වාසි පිළිබඳ සාර්ව විශ්ලේෂණය, තොරතුරු කර්මාන්තයේ සංවර්ධනයේ ඉතිහාසය සහ ලක්ෂණ, ජෛව ඖෂධ කර්මාන්තයේ සංවර්ධන ප්‍රවණතාවය, නැගී එන කර්මාන්ත තාක්‍ෂණ දාම සහ කාර්මික දාමවල සම්බන්ධීකරණ සංවර්ධනය
21	සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා ඇඟලුම් නිර්මාණ හා නිෂ්පාදන ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය	6	20.10 .2024	12.11 .2024	801,695 .28	විදේශීය	සාම්ප්‍රදායික චීන ඇඳුම්වල සංස්කෘතික පුහුණුව සහ නවීන යෙදීම, ඇඳුම් සැකිලි නිර්මාණය සහ නිෂ්පාදනය, විලාසිතා නිර්මාණශීලීත්වය පිළිබඳ විමර්ශන නිර්මාණය, චීන ඇඳුම්වල ලක්ෂණ

	වැඩසටහන	සහභාගි වූ නිලධාරීන්	කාල පරාසය		අයෝජනය (රු.)	සංචාරයේ ස්වභාවය	නිමැවුම
22	ITEC: තාක්ෂණික රෙදිපිළි වල නැගී එන ක්ෂේත්‍ර	1	10.11.2024	17.12.2024	109,666.88	විදේශීය	තාක්ෂණික රෙදිපිළි හැඳින්වීම, වියන ලද නොවන නිෂ්පාදන තාක්ෂණය, රෙදි ලක්ෂණ, තාක්ෂණික රෙදිපිළි යෙදුම්වල අවසාන භාවිතයන්, පටු පළල ලූම් නිෂ්පාදනය සහ යෙදීම, නිෂ්පාදනය සහ වෛද්‍ය රෙදිපිළි සඳහා වෝර්ප් ගෙතුම් යෙදුම සහ එහි යෙදීම්, තාක්ෂණික රෙදිපිළි නිෂ්පාදනවල ආරම්භකයින් සඳහා තාක්ෂණික-ආර්ථික විද්‍යාව.
23	ශ්‍රී ලංකාවට චීනයේ දරිද්‍රතාවය තුරන් කිරීමේ අත්දැකීම් පිළිබඳ සම්මන්ත්‍රණය	2	30.10.2024	15.11.2024	267,712.64	විදේශීය	චීනයේ කාර්මික, රැකියා, සෞඛ්‍ය සහ වෛද්‍ය සත්කාර, අධ්‍යාපනය සහ පාරිසරික දරිද්‍රතාවය පිටුදැකීමේ ප්‍රතිපත්තිය සහ භාවිතය.

පරිච්ඡේදය 07

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල වේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	-	-
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම.	රැස්වීම් 4ක් පවත්වා තිබේ. අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ	-	-
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර ඇති නමුත් ඔවුන් තවමත් එම වාර්තා ඉදිරිපත් කර නැත.	එම වාර්තා ලද වහාම මෙම කාර්යය නිම කිරීමට කටයුතු කරනු ලැබේ.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා තවමත් ඉදිරිපත් කර නැත.	එම වාර්තා ලද පසු අදාළ කාර්යය නිම කිරීමට කටයුතු කරනු ලැබේ.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ	-	-
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	.
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ.	-	
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**	අදාල නොවේ		
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම			
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම			
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම			

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		.
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ.	-	-

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ.	2026 වසරේ සිට සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු සැලසුම් කර ඇත.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ	-	-

Annexture

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/E/MOI/2024/FS

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2025 ජූනි 11 දින

කර්මාන්ත අමාත්‍යාංශය 16 JUN 2025 පාලන අංශය

කර්මාන්ත අමාත්‍යාංශය 17 JUN 2025 635 ලේකම් අංශය

අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 149, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත් (සිංහල,ඉංග්‍රීසි,දෙමළ) මේ සමඟ එවා ඇත.

ඩබ්.පී.ආර්.එන්. වීරක්කොඩි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

පිටපත: - ලේකම් : කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

IMT/E/MOI/2024/FS 2025 ජුනි 11 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම

ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංසෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) අමාත්‍යාංශය විසින් පවත්වාගෙන යනු ලබන ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් කර නොතිබූ අතර, සමාලෝචිත වර්ෂයේ මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශන ඒසීඒ-6 තුල රු.1,645,805 ක් දක්වා තිබූ නමුත් මූල්‍ය නොවන වත්කම් වලට අදාල භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් හා අමාත්‍යාංශයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වලට අදාල 2102, 2103 වැය විෂයයන් තුල දක්වා තිබූ වටිනාකම රු.13,123,501 ක් වී තිබූ හෙයින් රු.11,477,696 ක වෙනසක් පැවතුණි.

(ආ) අමාත්‍යාංශය විසින් වියදම් දරා ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කල යුතු වුවත් කර්මාන්ත සංවර්ධන අංශයෙන් ලද තොරතුරුවලට අනුව 1996 වර්ෂයේ සිට කර්මාන්තපුර 16 ක ඉදිකල පරිපාලන ගොඩනැගිලි 13 ක, කර්මාන්තශාලා 03 ක හා කාර්යාල නිවාස/සේවා ගොඩනැගිලි 02 ක වටිනාකම වූ රු.මිලියන 544.94 ක් 2024 දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබුණු ACA 6 අකෘතියේ 2024 දෙසැම්බර් 31 දිනට මගී වාහන වටිනාකම රු.737,323,781 ක් වුවද ඒ සඳහා විස්තරාත්මක උපලේඛණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) මෝටර් රථ වාහන පිළිබඳව සිගාස් තොරතුරු පද්ධතියෙහි තොරතුරු හා අමාත්‍යාංශයේ රථවාහන අංශයේ තොරතුරු පරීක්ෂා කිරිමේදී සිගාස් තොරතුරු පද්ධතිය තුල ඇතුළත් එකතු වටිනාකම රු.60,300,000ක් වූ රථවාහන පහක් අමාත්‍යාංශයේ රථවාහන අංශයෙන් ලබාදුන් තොරතුරු වල නොපැවතුණි.

(ඉ) සිගාස් වැඩසටහනේ හා භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් අනුව අමාත්‍යාංශය සතුව එකතු වටිනාකම රු.5,513,319ක් වූ යතුරු පැදි 35 ක් පවතින බව දක්වා තිබුණද අමාත්‍යාංශයේ රථවාහන අංශය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව යතුරු පැදි 2ක් පමණක්

අමාත්‍යාංශය විසින් භාවිතා කරන බව දක්වා තිබුණි.

(ඊ) අමාත්‍යාංශයට අයත් වාහන 26ක් සිගාස් වැඩසටහනේ වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) පුනරාවර්තන වැය විෂයයන් 32ක්, මූලධන වැය විෂයයන් 06ක් හා උප ව්‍යාපෘති 04කට අදාල වැය විෂයයන් 39ක් සඳහා රු.2,875,181,044 ක අධි ප්‍රතිපාදන සැලසීම හේතුවෙන් වර්ෂය තුල රු.1,605,189,978 ක් උපයෝජනය කල පසු රු.1,269,995,066 ක ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට 99 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 06ක හා මූලධන වැය විෂයයන් 05කට අදාලව වෙන් කර තිබූ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුලදී කිසිදු වියදමක් එම වැය විෂයයන් වලින් නොදැරීම මත රු.202,800,000 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ඇ) කිසියම් වැය විෂයයක් සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන, ප්‍රමාණවත් නොවේ යැයි අපේක්ෂා කරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා මු.රෙ.66 මඟින් හෝ පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් ප්‍රතිපාදන ලබා ගැනීමට අපේක්ෂා කිරීමේදී එම වැය විෂයය මඟින් ඉදිරියේදී දැරීමට සිදුවන ගෙවීම් පිළිබඳ හැකිතාක් නිවැරදිව තාර්කික පදනමකින් යුතු වන අයුරින් ඇස්තමේන්තු පිළියෙල කර ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කළ යුතු වුවත් රු.9,000,000 ක් ප්‍රතිපාදන වෙන්කර තිබූ වැය විෂයයකට මු.රෙ.66 මඟින් රු.2,000,000 ක්ද පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.3,885,000 ක්ද අමතර ප්‍රතිපාදන ලබාගෙන තිබූ නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට එහි ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.14,885,000 කින් රු.10,755,490 ක් පමණක් වියදම් කර රු.4,129,510 ක් ඉතිරි වී තිබුණි.

3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ බැරකම් ලේඛනය හා මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන iii) තුලට ඇතුලත් කර නොතිබූ සමාලෝචිත වර්ෂයේ අවස්ථා 49කට අදාල රු.4,115,868 ක බැරකම්, 2025 වර්ෂය තුලදී ගෙවා තිබුණි.

(ආ) 2019 වර්ෂයේ අවස්ථා 43ක් හා 2018 වර්ෂයේ එක් අවස්ථාවකට අදාල රු.727,693 ක බැරකම් 43 ක් පැවතියද එම බැරකම් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

3.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මු.රෙ. 104(03)	වැල්ලවාය කර්මාන්තපුරයේ ඉදිකල වැට හා ගේට්ටුවට අලාභ හානි සිදුවී තිබූ අතර එම අලාභ හානිය තක්සේරු කිරීමට අදාලව ප්‍රාරම්භක පරීක්ෂණය පැවැත්වීමට 2024 නොවැම්බර් 20 දින පරීක්ෂණ මණ්ඩලයක් පත්කර තිබුණද ප්‍රාරම්භක වාර්තාව විගණන දිනය වන 2025 මැයි 14 තෙක් ඉදිරිපත් කර නොතිබුණි.
(ii) මු.රෙ. 104 (04)	අලාභයක් සිදුවී මාස 03ක් ඇතුළතදී පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කල යුතු වුවද 2024 මාර්තු 21 දින රථය ගිනිගැනීම හා 2024 අප්‍රේල් 09 වන දින අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවීමට අදාලව සිදුවූ අලාභයන් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.
(iii) මු.රෙ.570 (අ)	සමාලෝචිත වර්ෂය අවසන් වන විට වර්ෂ දෙකකට වඩා වැඩි කාලයක සිට පවතින කොන්ත්‍රාත් සඳහා වූ රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ (6000-0-0-16-0-18) එකතුව

		රු.32,441,045 ක් වූ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.
(iv)	මු.රෙ. 756	සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි.
(v)	මු.රෙ. 772 හා 2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය	2023 වර්ෂයේදී හඳුනාගත් අපහරණය කල යුතු භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(ආ)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	වාහන 03ක පමණක් ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කර තිබුණු අතර අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන රථවාහන 95 කම සමාලෝචිත වර්ෂය තුල ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි.
(ඇ)	2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කලමනාකරණ චක්‍රලේඛය	සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත දන්වා යවා නොතිබුණි.
(ඈ)	අංක CGIR/2019/3 හා 2019 ජූලි 09 දිනැති දේශීය ආදායම් බදු කොමසාරිස්ගේ චක්‍රලේඛය	ගෙවන ලද එකතු කල අගය මත බදු (VAT) පිළිබඳ කාර්තු වශයෙන් දන්වා යැවිය යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි.
(ඉ)	2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරන ජාතික අයවැය චක්‍රලේඛය	ගමන් වියදම් සඳහා රු.450,000ක් අතිරේක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරිම

(අ) අක්කර 200 ක භූමි ප්‍රමාණයක් තුළ රයිගම කර්මාන්තපුරය පිහිටුවීමට අපේක්ෂා කර තිබුණද කර්මාන්තපුරය ආරම්භ කිරීමට පෙර ශක්‍යතා අධ්‍යයනයක් හා සිදු කළ යුතු සංවර්ධන කාර්යයන් සඳහන් කරමින් ව්‍යාපෘති සැලැස්මක් සකස් කිරීමකින් තොරව . 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 905 ක් වියදම් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ආයෝජකයෙකු කර්මාන්ත ආරම්භ කිරීමට ඉදිරිපත් නොවීම නිසා කර්මාන්තපුරය ආරම්භකිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් හැකියාවක් නොමැති හෙයින් දරා ඇති වියදම නිෂ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

(ආ) අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 10 ක 2019-2024 කාලසීමාවට අදාල මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත ආයතන 08 හි ප්‍රතිව්‍යුහගත කිරීමට අදාල කාර්යයන් ඉටු නොකිරීම හේතුවෙන් එම කාර්යයන් අවසන් වී නොතිබුණි.

4.1.2 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

2023 වර්ෂයේදී රු.8,383,056 ක් වැයකර වැල්ලවාය කර්මාන්තපුරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණ ද 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ මෙම කර්මාන්තපුරය සංවර්ධන කටයුතු සඳහා ක්‍රියාකාරකම් ඇතුළත් කරමින් ප්‍රතිපාදන වෙන්කර නොතිබීම නිසා මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනිම

(අ) කර්මාන්තපුර සංවර්ධනය යටතේ රජයේ ඉඩම් අක්කර 281.399 ක් ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද කර්මාන්තපුර 09 ක් සඳහා රජය විසින් රු.මිලියන 1542 ක පිරිවැයක් දරා ඇතත් ඒවායේ කිසිදු කර්මාන්තයක් ආරම්භ කර නොතිබුණි.

(ආ) දිස්ත්‍රික්ක 21 ක කර්මාන්තපුර ආරම්භ කිරීමේදී වෙන්කරන ලද මුළු ඉඩම් ප්‍රමාණය අක්කර 1,340 ක් වූවත් කර්මාන්ත සඳහා එයින් අක්කර 741.50 ක් පමණක් වෙන්කර තිබූ හෙයින් අක්කර 598.50 ක ඉඩම් සමාලෝචිත වර්ෂය අවසන් වන විට නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) 2017 වර්ෂයේ කළුතර රයිගම කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධිකලාපය තුල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව ලබාදුන් මධ්‍යම ඉංජිනේරු සේවා (පුද්) සමාගම (CESL), අදාල භූමියේ පවතින රබර් ගස් ඉවත් නොකිරීම, වැවිලි සමාගම්හී විරෝධතා හා ජලමාර්ග පද්ධතිය සම්පූර්ණ නොකිරීම යන හේතූන් පාදක කරගෙන 2025 අප්‍රේල් වන විටත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත් කටයුත්ත සම්පූර්ණ කර නොතිබුණි.

(ඇ) කරන්දෙනිය කර්මාන්තපුරයෙහි ප්‍රවේශ මාර්ග අලුත්වැඩියා කිරීම සඳහා රු.මිලියන 65.98 ක් වියදම් දරා තිබුණ ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එහි භෞතික ප්‍රගතිය සියයට 0 ක් වී තිබුණි. කටුනායක කර්මාන්තපුරයක් ඇති කිරීම සඳහා රු.මිලියන 4.1ක් ඇස්තමේන්තු කර තිබුණද එහි භෞතික ප්‍රගතිය සියයට 2 ක් තරම් අඩු මට්ටමක පැවතුණු අතර කිසිදු මුදලක් වියදම් දරා නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තා පරීක්ෂාවේදී ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 772 ක් වූ ව්‍යාපෘති 07 ක භෞතික ප්‍රගතිය 10% - 25% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 185.59 ක් වූ ව්‍යාපෘති 21 ක භෞතික ප්‍රගතිය 25% - 50% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 109.08 ක් වූ ව්‍යාපෘති 17 ක භෞතික ප්‍රගතිය 50% - 75% ත් අතර ද ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 342.15 ක් වූ ව්‍යාපෘති 35 ක භෞතික ප්‍රගතිය 75% - 99% ත් අතර පරාසයක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසාන වීමට පෙර මෙම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඊ) කරන්දෙනිය කර්මාන්තපුරයේ කුරුඳු සැකසුම් මධ්‍යස්ථානයක් ඉදිකිරීම, අත්යන්ත්‍ර රෙදිපිලි කර්මාන්තය සඳහා අමුද්‍රව්‍ය කලමනාකරණ වැඩසටහන සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණ ද එම ව්‍යාපෘති සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාත්මක කර නොතිබුණි.

4.1.4 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

කර්මාන්තපුරයන් ආරම්භ කිරීමේදී ව්‍යාපෘති යෝජනාවන්ට අනුව කර්මාන්තපුර 24 ක අපේක්ෂිත සේවක සංඛ්‍යාව 32,588 ක් වුවත් සත්‍ය වශයෙන් සේවයේ යෙදෙන සංඛ්‍යාව 15,949 ක් හෙවත් සියයට 51 ක අවම මට්ටමක පැවති හෙයින් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීම අවම මට්ටමක පැවතුණි.

4.1.5 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ

යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව මෙම කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇත. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන 08ක 2015 – 2024 කාල සීමාවට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) 2023 වර්ෂයේ අපහරණය කිරීම සඳහා හඳුනාගෙන තිබූ වාහන 08කින් එක් රථ වාහනයක් පමණක් වෙන්දේසි කර තිබූ අතර වාහන 03ක් කර්මාන්ත සංවර්ධන මණ්ඩලයට පවරාදීමට කටයුතු කර ඇති අතර ඉතිරි වාහන 04 සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) අපහරණය කිරීමට අනුමැතිය ලබාදී තිබූ රථ වාහන හැරුණුකොට වාහන 06 ක් අලුත්වැඩියා කිරීමකින් තොරව අමාත්‍යාංශ පරිශ්‍රයේ හා අලුත්වැඩියා සඳහා යොමු කරන ලද ආයතනවල ගාල් කර තිබුණි.

(ඇ) එකතු වටිනාකම රු.52,200,000 ක් වූ රථ වාහන 12ක අයිතිය පවරාගෙන නොතිබුණ ද වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සිගාස් වැඩසටහනෙහි රථවාහන පිළිබඳ තොරතුරුවල රථවාහන අංකය සඳහන් නොවූ එකතුව රු.79,848,262 ක් වූ රථවාහන 8ක් පැවතුණි.

4.3 රජයේ නිලධාරීන් ඇප තැබීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 880 ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් විසින් රජයේ නිලධාරීන්ගේ ඇප අඥා පනතට අනුකූලව ඇප තැබිය යුතු වුවත් අමාත්‍යාංශයේ නිලධාරීන් එසේ සිදුකර නොතිබුණි.

4.4 පාඩු හා හානි

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය තුල මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ (i) වර්ෂය තුල අලාභ අයකර ගැනීම්/ කපාහැරීම්/ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000 ට වැඩි සිද්ධි 11 ක් සඳහා රු.28,700,797ක් සටහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ ලිපි ප්‍රකාරව එම ශේෂය සිද්ධි 13 ක් සඳහා රු.29,267,359 ක් වීම නිසා රු.566,561ක වෙනසක් ද අලාභයේ ස්වභවය අනුව වන

වර්ගීකරණයෙහි වාහන සිද්ධි 10 ක් සහ අනෙකුත් සිද්ධි 03 ක් වශයෙන් පිළිවෙළින් රු.28,219,497 ක් හා රු.520,000 ක් දක්වා තිබූ නමුත් එය වාහන සිද්ධි 11 ක් සහ අනෙකුත් සිද්ධි 04 ක් වශයෙන් පිළිවෙළින් රු.28,619,559 ක් හා රු.686,500 ක් වීම නිසා එම ශේෂයන්ගේ පිළිවෙළින් රු.400,062 ක් හා රු.166,500 ක වෙනසක් ඇති වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශය තුල මු.රෙ.106 හා මු.රෙ.113 යටතේ වන පාඩු, පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයේ (ii) තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000 ට වැඩි සිද්ධි 02 ක් සඳහා රු.107,574 ක් සටහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ ලිපි ප්රකාරව එම ශේෂය සිද්ධි 04 ක් සඳහා රු.377,557 ක් වීම නිසා රු.269,978 ක වෙනසක් ද අලාභයේ ස්වභාවය අනුව වන වර්ගීකරණයෙහි වාහන සිද්ධි 02 ක් සඳහා රු.107,574 ක් සඳහන් කර තිබූ නමුත් විගණනයට ඉදිරිපත් කර තිබූ ලිපි ප්‍රකාරව එය වාහන සිද්ධි 03 ක් සහ අනෙකුත් සිද්ධියක් වශයෙන් පිළිවෙළින් රු.211,052 ක් හා රු.166,500 ක් වීම නිසා එම ශේෂයන් අතර රු.269,978 ක වෙනසක් පැවතුණි.

4.5 කළමනාකරණ දුර්වලතා

(අ) මියගිය නිලධාරින් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.193,787 ක ශේෂයක්ද විශ්‍රාම ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.101,386 ක ශේෂයක්ද සේවය හැර ගොස් සිටින නිලධාරීන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු රු.364,817 ක ශේෂයක්ද වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන අතර එම ශේෂ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය නොවී පැවතුණි.

(ආ) 2024 මාර්තු 21 දින ගිනිගැනීමට ලක් වූ මෝටර් රථයක් නැවත අලුත්වැඩියා කිරීමට නියෝජිත ආයතනය වන Micro Cars Limited ආයතනය විසින් රු.602,809 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණු අතර මෙම අලාභය සඳහා රක්ෂණ වන්දි ලබාගැනීම විගණිත දිනය වන 2025 මැයි 14 තෙක් සිදුකර නොතිබූ අතර අලුත්වැඩියා කටයුතු ද සිදුකර නොතිබුණි.

(ඇ) අමාත්‍යාංශ ගොඩනැඟිල්ලට යාබද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී ඉදිකිරීම් ආයතනයේ දෝෂයන් හේතුවෙන් 2024 අප්‍රේල් 09 දින අමාත්‍යාංශයේ කාණු පද්ධතිය අවහිර වී අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවී තිබුණු අතර මෙ හේතුවෙන් සිදුවූ අලාභය රු.821,286 ක් බවට සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් තක්සේරු කර තිබුණි. මෙම අලාභය ගෙවීමට මාර්ගය ඉදිකිරීම් ආයතනය එකඟවී තිබුණ

ද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 28 වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර මූල්‍ය ප්‍රකාශය තුල මේ පිළිබඳව අනාවරණය කිරීමද සිදු කර නොතිබුණි.

(ඇ) බුත්තල කර්මාන්තපුරය පිහිටුවා වර්ෂ 18 ක කාලයක් ගතවී තිබුණද කිසිදු කර්මාන්තකරුවෙකු බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණු අතර එක් කර්මාන්තකරුවෙකු පමණක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත රු.1,068,000 ක බද්දක් ගෙවා තිබුණි.

(ඉ) රයිගම් කර්මාන්තපුරයේ රු.මිලියන 87.96ක වියදමක් දරා පරිපාලන ගොඩනැගිල්ලක් හා බුත්තල කර්මාන්තපුරයේ රු.මිලියන 3.585 ක වියදමක් දරා නිල නිවාසයක් ඉදිකර තිබුණද ඒවා භාවිතයකින් හා නිසියාකාරව නඩත්තු කිරීමකින් තොරව පැවතීම නිසා එම ගොඩනැගිල්ල වෙනුවෙන් (ඉදි කිරීම) දරන ලද වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(ඊ) බුත්තල කර්මාන්තපුරයෙහි කාඩ්බෝඩ් හා රෝහල් උපකරණ නිෂ්පාදන කටයුතු කර්මාන්තයක් ආරම්භ කිරීම සඳහා අක්කර 01 පර්චස් 05 ක බිම් ප්‍රමාණයක් කර්මාන්තකරුවෙකුට ලබා දී තිබු නමුත් අදාල ආයෝජකයා විසින් ඉදිරිපත් කර තිබූ ව්‍යාපාර සැකසුමට පටහැනි පොල්ලෙලි ආශ්‍රිත ව්‍යාපාරයක් කරගෙන යන බවත් ඒ සඳහා අදාල අනුමැතින් නොතිබූ බවත් එම කාර්යය සඳහා වෙන්කර දී තිබූ ඉඩම් ප්‍රමාණය ඌන උපයෝජනය වී තිබුණි.

(උ) දේශීය රතු මැටි උළු නිෂ්පාදනය සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති සහතික ලබාගැනීමට අවශ්‍ය මූල්‍ය සහාය ලබාදීම සඳහා වූ ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට 2016 වර්ෂයේදී රු.4,298,224 ක් ගෙවා තිබුණ ද එහි සත්‍ය වියදම රු.3,032,462 ක් විය. ඒ අනුව, වැඩිපුර ගෙවා තිබූ රු.1,265,762 ක මුදල සුදුසු කර්මාන්තශාලා තෝරාගෙන ප්‍රමිති සහතික ලබාගැනීමේ කාර්යයට යොදාගන්නා බව විගණනයට දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය දක්වාම මෙම මුදලින් අපේක්ෂිත කාර්ය ඉටුව නොතිබුණි.

(ඌ) කර්මාන්තකරුවන් වෙත ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන්කිරීම් ලිපියට අනුව ඉඩම් වෙන්කිරීමෙන් පසුව අවුරුදු 35ක දීර්ඝකාලීනව බදු ගිවිසුමක් අත්සන් කලයුතු වුවද කර්මාන්තපුර 30ක කර්මාන්තකරුවන් 347 ක් සඳහා බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණී.

(එ) ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීම සඳහා වන ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කර ගැනීම, එළිපෙහෙළි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු.3,266,558 ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්ඵල වියදම් බවට පත්ව තිබුණි.

5 යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන අංශය විසින් 2024 වර්ෂය සඳහා විගණන විමසුම් 13ක් නිකුත් කිරීමට අපේක්ෂා කර තිබුණද නිකුත් කරන ලද විගණන විමසුම් ගණන 02කට සීමා වී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

සමාලෝචිත වර්ෂය අවසන් වන විට සමස්ථ පුරප්පාඩු 233 ක් පැවති අතර එයින් ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක් තෘතියික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද්විතියික මට්ටමේ පුරප්පාඩු 184 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 26 ක් පැවතුණි.

ඩබ්ලිව්.ජී .ආර්.එන්. වීරක්කොඩි
ජ්‍යෝෂ්ඨ සහකාර විගණකාධිපති
වැඩබලන විගණකාධිපති වෙනුවට.